# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය

# ඇගයීම් වාර්තාව

# 2021

## 01

## සිංහල

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021

# ඇගයීම් වාර්තාව

# 01 - සිංහල

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනත අනුව පිරිවෙන් (සා.පෙළ) විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

පෙරදී මූලික පිරිවෙන් විභාගය ලෙස හැඳින් වූ මෙය 2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ අතර මෙම විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පිරිවෙන් (සා.පෙළ) විභාගය - 2021 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා පහක් යටතේ ගොනු කර ඇත.

පිරිවෙන් සාමාන්‍ය පෙළ සිංහල විෂයයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මක ව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබාදීමේ පටිපාටිය, I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය , ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේ ද I ප්‍රශ්න පත්‍රයට අදාළ ව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයට ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ , නිගමන හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන් ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්නපත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතරවන හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කර ගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය ( Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය(Item Response Theory) යොදාගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රියව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2024 ජූලි 31

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක වන මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීමත් යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මඟින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවී යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සාම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ එළදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පිත විෂයයන් හයකින් ද සමන්විත වේ.

2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ මූලික පිරිවෙන් විභාගය පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ දී අපේක්ෂකයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් 02ක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂය ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන් ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා බිහි කරන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | එච්. කේ. සී. කේ. කුමාරි<br>සහකාර විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| සංස්කරණය | : | එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා I ,<br>360/6, මායා මාවත, මාකුඹුර, පන්නිපිටිය<br><br>ශාස්ත්‍රපති පූජ්‍ය කඩවත රතනවංශ හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>ජාතික භික්ෂු අධ්‍යයන ආයතන මහ පිරිවෙන<br>රන්මුතුගල, කඩවත |
| ලේඛක මණ්ඩලය | : | එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා I ,<br>360/6, මායා මාවත, මාකුඹුර, පන්නිපිටිය<br><br>ශාස්ත්‍රපති පූජ්‍ය කඩවත රතනවංශ හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>ජාතික භික්ෂු අධ්‍යයන ආයතන මහ පිරිවෙන<br>රන්මුතුගල, කඩවත<br><br>පූජ්‍ය තෙරිපැහැ ධම්මින්ද හිමි<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>විජේරත්න වනසුන්දර<br>ගුරු සේවය I (විශ්‍රාමික)<br>අක්කර **10** පාර, පොල්වත්ත,<br>අම්බුළුගල, මාවනැල්ල |
| පරිගණක පිටපත සැකසුම | : | ජේ. කේ. එච්. නවෝදනි ජයනෙත්ති<br>දත්ත සටහන් සහකාර |
| පිටකවර නිර්මාණය | : | ඒ. එල්. කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරි |

# පටුන


පිටු අංකය

**හැඳින්වීම** i

**පෙරවදන** ii

**පටුන** iv

**වගු නාමාවලිය හා ප්‍රස්තාර නාමාවලිය** v

**1. සිංහල විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.1 සිංහල විෂය අධ්‍යයනයේ අරමුණු 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු 2

**I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය**

2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු 6

2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 6

2.2. I ප්‍රශ්න පත්‍රය ( ප්‍රශ්න 1 සිට 40 දක්වා) 7

2.3 I ප්‍රශ්න පත්‍රයෙහි I කොටස සඳහා සාධනය 14

2.4 I ප්‍රශ්න පත්‍රයේ I කොටස තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය 16

2.5 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටසහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 20

2.6 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටසහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය 20

2.7 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටස සඳහා සාධනය 21

2.8 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටස සඳහා එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 22

**II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය**

3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 39

3.2 II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය 40

3.3 II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය (ලකුණු ප්‍රාන්තර අනුව) 40

3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 41

3.5 II ප්‍රශ්න පත්‍රය එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය 42

3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 61

**4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු හා විශේෂ උපදෙස්** 62

**5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා** 63

**වගු නාමාවලිය**


| | | පිටු අංකය |
|---|---|---|
| වගුව 1.1 | විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | 02 |
| වගුව 1.2 | අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය | 02 |
| වගුව 1.3 | පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව | 03 |
| වගුව 1.4 | ලකුණු ලබාගෙන ඇති ආකාරය පන්ති ප්‍රාන්තර අනුව | 04 |
| වගුව 2.1 | I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 13 |
| වගුව 2.2 | I පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) | 15 |
| වගුව 2.3 | තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක | 16 |


**ප්‍රස්තාර නාමාවලිය**


| | | පිටු අංකය |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | I පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 14 |
| ප්‍රස්තාරය 2.2 | I පත්‍රයේ තේමාව අනුව එක් එක් අයිතමයෙහි පහසුතා දර්ශකය | 17 |
| ප්‍රස්තාරය 2.3 | I ප්‍රශ්න පත්‍රයේ II කොටස - ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 20 |
| ප්‍රස්තාරය 2.4 | I ප්‍රශ්න පත්‍රයේ II කොටස - ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 20 |
| ප්‍රස්තාරය 2.5 | I ප්‍රශ්න පත්‍රයේ II කොටස ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 21 |
| ප්‍රස්තාරය 2.6 (a) | 1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 24 |
| ප්‍රස්තාරය 2.6 (b) | 1 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 24 |
| ප්‍රස්තාරය 2.7 (a) | 2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 28 |
| ප්‍රස්තාරය 2.7 (b) | 2 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 28 |
| ප්‍රස්තාරය 2.8 (a) | 3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 32 |
| ප්‍රස්තාරය 2.8 (b) | 3 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 32 |
| ප්‍රස්තාරය 2.9 (a) | 4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 34 |
| ප්‍රස්තාරය 2.9 (b) | 4 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 34 |
| ප්‍රස්තාරය 2.10 (a) | 5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 37 |
| ප්‍රස්තාරය 2.10 (b) | 5 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 37 |
| ප්‍රස්තාරය 3.1 | II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 40 |
| ප්‍රස්තාරය 3.2 | II ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 40 |
| ප්‍රස්තාරය 3.3 | II ප්‍රශ්න පත්‍රයේ II කොටසේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 41 |
| ප්‍රස්තාරය 3.4 (a) | 1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 44 |
| ප්‍රස්තාරය 3.4 (b) | 1 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 44 |
| ප්‍රස්තාරය 3.5 (a) | 2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 48 |
| ප්‍රස්තාරය 3.5 (b) | 2 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 48 |
| ප්‍රස්තාරය 3.6 (a) | 3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 50 |
| ප්‍රස්තාරය 3.6 (b) | 3 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 51 |
| ප්‍රස්තාරය 3.7 (a) | 4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 53 |
| ප්‍රස්තාරය 3.7(b) | 4 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 54 |

| | | |
|---|---|---|
| ප්‍රස්තාරය 3.8 (a) | 5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 55 |
| ප්‍රස්තාරය 3.8 (b) | 5 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 56 |
| ප්‍රස්තාරය 3.9 (a) | 6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 58 |
| ප්‍රස්තාරය 3.9 (b) | 6 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 58 |
| ප්‍රස්තාරය 3.10 (a) | 7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 59 |
| ප්‍රස්තාරය 3.10 (b) | 7 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 60 |
| ප්‍රස්තාරය 3.11 | එක් එක් ප්‍රශ්නයේ පහසුතාව හා අපේක්ෂකයන් ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 61 |

# 1 සිංහල විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 සිංහල විෂයය අධ්‍යයනයේ අරමුණු

1. ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කිරීම
2. සිංහල භාෂාවේ ව්‍යාකරණ සහ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම
3. භාෂාවේ වාච්‍යාර්ථ, ලක්ෂ්‍යාර්ථ, ව්‍යාංග්‍යාර්ථ වටහා ගැනීම
4. ප්‍රකාශනය, ව්‍යවහාරය හා අර්ථග්‍රහණ ශක්තිය වර්ධනය කිරීම
5. අවබෝධය, විශ්ලේෂණය, සංස්ලේෂණය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම
6. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලී හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම, අවබෝධය ලබා ගැනීම හා වාග්මාලාව පෝෂණය කර ගැනීම
7. විවිධ යුගවලට අයත් සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොටගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කිරීම
8. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් රසඥතාව වර්ධනය කර ගැනීම තුළින් ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම
9. විශ්වවිශ්‍රැති සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම
10. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයට හුරු වීම
11. සිංහල භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව සහ තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම
12. සන්නිවේදන කාර්යය පහසුකරලීම සඳහා සාම්ප්‍රදායික භාෂා උපාංග නිවැරදි ව භාවිතයට හුරු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

**වගුව 1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව**

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2352 | 23 | 2375 |
| ඉංග්‍රීසි | 16 | 0 | 16 |
| එකතුව | **2368** | **23** | **2391** |

**වගුව 1.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය**

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 25 | 1.05 | 1 | 4.35 | 26 | 1.09 |
| B | 156 | 7.90 | 3 | 4.55 | 159 | 7.9 |
| C | 655 | 28.00 | 7 | 4.55 | 662 | 27.8 |
| S | 1054 | 36.30 | 7 | 45.45 | 1061 | 36.4 |
| W | 478 | 20.70 | 5 | 45.45 | 483 | 20.93 |
| එකතුව | **2368** | **100.00** | **23** | **100.00** | **2391** | **100.00** |

**වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව**

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 154 | 1 | 0.65 | 11 | 7.14 | 52 | 33.77 | 70 | 45.45 | 134 | 87.01 | 20 | 12.99 |
| ගම්පහ | 198 | 1 | 0.51 | 19 | 9.60 | 62 | 31.31 | 86 | 43.43 | 168 | 84.85 | 30 | 15.15 |
| කළුතර | 177 | 10 | 5.65 | 15 | 8.47 | 51 | 28.81 | 56 | 31.64 | 132 | 74.58 | 45 | 25.42 |
| මහනුවර | 249 | 4 | 1.61 | 15 | 6.02 | 73 | 29.32 | 123 | 49.40 | 215 | 86.35 | 34 | 13.65 |
| මාතලේ | 86 | 0 | 0.00 | 6 | 6.98 | 16 | 18.60 | 42 | 48.84 | 64 | 74.42 | 22 | 25.58 |
| නුවරඑළිය | 35 | 0 | 0.00 | 1 | 2.86 | 6 | 17.14 | 22 | 62.86 | 29 | 82.86 | 6 | 17.14 |
| ගාල්ල | 174 | 2 | 1.15 | 16 | 9.20 | 45 | 25.86 | 76 | 43.68 | 139 | 79.89 | 35 | 20.11 |
| මාතර | 187 | 3 | 1.60 | 16 | 8.56 | 63 | 33.69 | 68 | 36.36 | 150 | 80.21 | 37 | 19.79 |
| හම්බන්තොට | 130 | 1 | 0.77 | 5 | 3.85 | 44 | 33.85 | 47 | 36.15 | 97 | 74.62 | 33 | 25.38 |
| වවුනියාව | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 64 | 0 | 0.00 | 2 | 3.13 | 13 | 20.31 | 35 | 54.69 | 50 | 78.13 | 14 | 21.88 |
| ත්‍රිකුණාමලය | 12 | 0 | 0.00 | 1 | 8.33 | 5 | 41.67 | 5 | 41.67 | 11 | 91.67 | 1 | 8.33 |
| කුරුණෑගල | 232 | 1 | 0.43 | 13 | 5.60 | 45 | 19.40 | 110 | 47.41 | 169 | 72.84 | 63 | 27.16 |
| පුත්තලම | 54 | 0 | 0.00 | 2 | 3.70 | 11 | 20.37 | 31 | 57.41 | 44 | 81.48 | 10 | 18.52 |
| අනුරාධපුර | 145 | 1 | 0.69 | 9 | 6.21 | 29 | 20.00 | 63 | 43.45 | 102 | 70.34 | 43 | 29.66 |
| පොලොන්නරුව | 58 | 0 | 0.00 | 2 | 3.45 | 14 | 24.14 | 26 | 44.83 | 42 | 72.41 | 16 | 27.59 |
| බදුල්ල | 116 | 1 | 0.86 | 1 | 0.86 | 28 | 24.14 | 69 | 59.48 | 99 | 85.34 | 17 | 14.66 |
| මොණරාගල | 74 | 1 | 1.35 | 4 | 5.41 | 20 | 27.03 | 29 | 39.19 | 54 | 72.97 | 20 | 27.03 |
| රත්නපුර | 136 | 0 | 0.00 | 13 | 9.56 | 46 | 33.82 | 56 | 41.18 | 115 | 84.56 | 21 | 15.44 |
| කෑගල්ල | 109 | 0 | 0.00 | 8 | 7.34 | 39 | 35.78 | 46 | 42.20 | 93 | 85.32 | 16 | 14.68 |
| සමස්ත ප්‍රතිඵලය | 2,391 | 26 | 1.09 | 159 | 6.65 | 662 | 27.69 | 1,061 | 44.37 | 1,908 | 79.80 | 483 | 20.20 |

**වගුව 1.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව**

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 -100 | 0 | 0.00 | 2391 | 100.00 |
| 81 - 90 | 3 | 0.13 | 2391 | 100.00 |
| 71 - 80 | 22 | 0.92 | 2388 | 99.87 |
| 61 - 70 | 134 | 5.60 | 2366 | 98.95 |
| 51- 60 | 299 | 12.51 | 2232 | 93.35 |
| 41 - 50 | 507 | 21.20 | 1933 | 80.84 |
| 31 - 40 | 636 | 26.60 | 1426 | 59.64 |
| 21 - 30 | 516 | 21.58 | 790 | 33.04 |
| 11 - 20 | 243 | 10.16 | 274 | 11.46 |
| 01 - 10 | 31 | 1.30 | 31 | 1.30 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

ඉහත වගුව අධ්‍යයනයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදාහරණය :

31 - 40 පන්ති ප්‍රාන්තරය සැලකීමේ දී,

සිංහල විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2391 අතුරෙන් 31 - 40 පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 636කි. එය ප්‍රතිශතයක් වශයෙන් 26.60%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂක සංඛ්‍යාව 1426කි. එය ප්‍රතිශතයක් වශයෙන් 59.64%කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2 . I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**I පත්‍රය** **- කාලය : පැය 03යි.**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

**I කොටස** - වරණ 4 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 40කි.

**II කොටස** - මෙම කොටස ප්‍රශ්න පහකින් සමන්විතය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටස සඳහා ලකුණු 80කි.

1 ප්‍රශ්නය : කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විතය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

2 ප්‍රශ්නය : රචනය ලකුණු 25කි. (ව්‍යුහගත තේමා 4ක් අතුරෙන් එකක් තෝරා ගත යුතු ය.)

3 ප්‍රශ්නය : සාරාංශකරණය ලකුණු 10කි.

4 ප්‍රශ්නය : අවබෝධය ලකුණු 10කි.

5 ප්‍රශ්නය : ප්‍රායෝගික ලේඛනය ලකුණු 15කි. (වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් ප්‍රශ්න එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

**I පත්‍රය සඳහා මුළු ලකුණු = 40 + 80 = 120**

## 2.2 I ප්‍රශ්න පත්‍රය - 1 කොටස

**I කොටස**

සැලකිය යුතුයි :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- අංක 1 සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

*(ලකුණු 01 × 40 = 40 යි)*

- අංක **1** සිට **3** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප පිළිතුර තෝරන්න.

1. මිනිහගේ කරල පැහිලා මුලින් උදව් කරපු යාළු මිත්‍රයො මතකත් නෑ දැන්
   (1) අස්වනු නෙළීමට ආසන්න වෙලා (2) අතමිට සරු වෙලා
   (3) කරල් පැහිලා (4) අවාසනාවන්ත කාලය එළඹිලා

2. ගමේ හිටියොත් වගාවක් වෙන්නේ නැහැයි කියල මහත්තය මට මෙහෙන් යන්න කිව්ව
   (1) දියුණුවක් (2) ගොවිතැනක්
   (3) වෙළෙඳාමක් (4) ඉගෙනීමක්

3. දැන් ඔය වැදි **බණ** කිව්වට එයාගෙ ඇතුළාන්තය ගමේ කවුරුත් දන්නවා
   (1) වැද්දන්ට කියන බණ (2) නිෂ්ප්‍රයෝජන කතා
   (3) තමා වැරදි කරමින් අනුන්ට දෙන අවවාද (4) ආඩම්බර කතා

4. අ, උ, ඔ යන නාම්‍ය ස්වරවල අනාම්‍ය ස්වර පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) ඇ, එ, ඉ (2) එ, ඇ, ඉ (3) ඉ, එ, ඇ (4) ඇ, ඉ, එ

5. පහත සඳහන් පදවල ඇතුළත් සඤ්ඤක අක්ෂර සෑදීමට උපයෝගි වූ අර්ධ නාසික්‍ය අක්ෂර පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
   සඟ, දඬු, අඹ, සඳ
   (1) ඞ්, ණ්, ම්, න් (2) ණ්, ම්, ඞ්, න් (3) න්, ණ්, ඞ්, ම් (4) ඞ්, න්, ම්, ණ්

6. පහත දැක්වෙන පදවල යංශය, රකාරාංශය, රේඵය, විසර්ගය පිළිවෙළින් යෙදී ඇති පද පේළිය කුමක් ද?
   (1) දුඃඛදායක, ප්‍රභාතය, වෛශාඛ්‍ය, අනඟි (2) මහේශාක්‍ය, ක්‍රමානුකූල, මහාසි, අන්තඃපුර
   (3) දූර්භාග්‍ය, ගෞරවාර්ථීය, ග්‍රාමාරක්ෂක, දුඃශීල (4) ග්‍රහණිය, ගෘහනිර්මාණ, නීත්‍යනුකූල, දුඃසාධන

7. අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) පරිවෙණාධිපති, විද්‍යාලයාධිපති, විහාරාධිපති, ශාලාධිපති
   (2) දිනේශ්වර, ජිනේශ්වර, මහේශ්වර, නරේශ්වර
   (3) නේපථ්‍යාගාරය, ශල්‍යාගාරය, විද්‍යාගාරය, කලාගාරය
   (4) අවස්ථෝචිත, ප්‍රස්තෝචිත, නාට්‍යෝචිත, කාලෝචිත

8. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) කාර්‍යාලය, ප්‍රාථමික, සම්ප්‍රදාය, විශිෂ්ට (2) පරිසණකය, මධ්‍යකාලීන, කනිෂ්ඨ, ශික්ෂණය
   (3) ප්‍රවෘත්ති, කෘතීම, පිළියෙල, සමස්ථ (4) වර්තමාන, ගනුදෙනු, වීරෝදාර, ප්‍රකාශන

9. පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියා පදවල ධාතු ප්‍රකෘති නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

වෙළෙන්දියක මෙන් සැරසුණු ශිෂ්‍යාවක් වේදිකාවට **පිවිස** එළවළු **විකුණන** අයුරු රඟ **දක්වයි.**

(1) සරස්, පිවිස්, විකුණ, දක් (2) සරස, පිවිස, විකුණ, දක්
(3) සැරසී, පිවිසු, විකුණන, දක්ව (4) සැරසු, පිවිස, විකුණ, දක්ව

10. අනුක්ත බහුවචන පද දෙකක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) වියතුන්, කම්කරුවෙකු, විනිසුරුවරු, කාර්මිකයෙක්
(2) මාධ්‍යවේදීහු, තාර්කිකයන්, උපාධිධාරීහු, ප්‍රවීණයෙක්
(3) ශිල්පියෙක්, බහුශ්‍රැතයන්, ප්‍රදර්ශකයෝ, දිළින්දෝ
(4) ශාස්ත්‍රඥයින්, ගවේෂකයකු, තානාපති, ගායිකාවන්

11. මුලින් දැක්වෙන සන්ධි වර්ගවලට නොගැළපෙන නිදසුනක් සහිත වරණය කුමක් ද?

(1) ද්විත්ව රූප සන්ධිය : කුරුල්ලා, තල්ලත්ත, රැක්කත්තන, උදැල්ල
(2) ස්වර සන්ධිය : සුරත, පුළුලුකුල, නුවනග, මුලසුන
(3) ගාත්‍රාදේශ සන්ධිය : පිරියම්, බුත්සරණ, ගිනියම්, දඬුවම්
(4) ස්වරාදේශ සන්ධිය : මහෝදර, ධනේෂ්වර, දෑත, ග්‍රාමෝදය

12. පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති රූප අනුපිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරන්න.

**මහජන සෞඛ්‍ය පරීක්ෂකයන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ සේවය ඇගයීම සඳහා ඔවුන්ට යතුරුපැදි සැපයීමට රජය විසින් තීරණයක් ගෙන තිබේ.**

(1) කර්ම, සම්බන්ධ, සම්ප්‍රදාන, කර්තෘ (2) සම්ප්‍රදාන, සම්බන්ධ, කර්ම, කර්තෘ
(3) කර්ම, සම්ප්‍රදාන, කර්තෘ, සම්බන්ධ (4) කර්තෘ, සම්බන්ධ, සම්ප්‍රදාන, කර්ම

13. මුලින් දී ඇති සමාස වර්ගයට ඇතුළත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) අව්‍යය සමාසය : අනුරුව, සුචරිත, උපැස්, අකටයුතු
(2) විශේෂණ සමාසය : පාතඹර, දසපනත, ගංතුන, ගුරුළුගෝමී
(3) විභක්ති සමාසය :ගෘහභාණ්ඩ, ළමාගී, මීදුම්, නවම්මස
(4) දකාරාර්ථ සමාසය : තොලකට, කනකර, කැඩුම්බිඳුම්, අඹුසැමි

14. තද්ධිත නාමයක් ඇතුළත් නොවන වාක්‍යය තෝරන්න.

(1) ආබාධිත දරුවන් වෙනුවෙන් විශේෂ අධ්‍යාපන ආයතන දිවයිනේ බොහෝ ප්‍රදේශවල පිහිටුවා තිබේ.
(2) අන්තර් විද්‍යාලයීය විවාද තරග සඳහා දිස්ත්‍රික්කයේ සියලු ම මහා විද්‍යාලවලට ආරාධනා කර තිබේ.
(3) ග්‍රාමීය ප්‍රදේශවාසීන් මුහුණ දෙන නොවිසඳුණු ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම මෙම වැඩසටහනේ ප්‍රමුඛතම අරමුණ වේ.
(4) ඉදිරි දින කීපය තුළ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන කාලගුණ අනාවැකි පිළිබඳ ව සැලකිල්ලෙන් සිටින ලෙස ධීවර ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

15. විසින්, ගෙන්, ගේ, කෙරෙහි යනු විභක්ත්‍යර්ථයේ නිපාත පදයි. ඒ අනුව පහත සඳහන් වාක්‍යයේ තද කළ අකුරක මුද්‍රිත පද අයත් වන නිපාත පද වර්ග පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

ඈත සිට දුරේක්ෂයකින් බලන්නෙකුට මෙහි නිරතුරු ව සැරිසරන මුවන් හා ගෝනුන් ළඟ සිටින සතුන් සේ දැක ගත හැකි ය.

(1) කාලාර්ථයේ නිපාත, උපමාර්ථයේ නිපාත, සීමාර්ථයේ නිපාත, සමුච්චයාර්ථයේ නිපාත
(2) සීමාර්ථයේ නිපාත, කාලාර්ථයේ නිපාත, සමුච්චයාර්ථයේ නිපාත, උපමාර්ථයේ නිපාත
(3) සමුච්චයාර්ථයේ නිපාත, උපමාර්ථයේ නිපාත, කාලාර්ථයේ නිපාත, සීමාර්ථයේ නිපාත
(4) සීමාර්ථයේ නිපාත, උපමාර්ථයේ නිපාත, කාලාර්ථයේ නිපාත, සමුච්චයාර්ථයේ නිපාත

16. පහත දැක්වෙන වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කෘදන්ත පද පිළිවෙළින් යෙදුණු පද පේළිය කුමක් ද?

භාණ්ඩ නිෂ්පාදනයේ සිට පරිභෝජනය දක්වා කෙටි කලක් ගත වූවත් ඒවායින් ඉවත් කරන පොලිතීන් දවටන නිසා වැනසුණු පරිසරය දිගු කලක් මිහිමත පවතිනු ඇත.

(1) භාවාර්ථ කෘදන්ත, කර්මකාරක කෘදන්ත, කරණකාරක කෘදන්ත, කර්තෘකාරක කෘදන්ත
(2) කරණකාරක කෘදන්ත, කර්මකාරක කෘදන්ත, භාවාර්ථ කෘදන්ත, කර්තෘකාරක කෘදන්ත
(3) කර්මකාරක කෘදන්ත, භාවාර්ථ කෘදන්ත, කර්තෘකාරක කෘදන්ත, කරණකාරක කෘදන්ත
(4) කර්තෘකාරක කෘදන්ත, කරණකාරක කෘදන්ත, කර්මකාරක කෘදන්ත, භාවාර්ථ කෘදන්ත

17. මාර්ග තදබදය අවම **කිරීම සඳහා** පනවා ඇති මංතීරු නීතිය නිසි පරිදි ක්‍රියාත්මක වෙමින් පවතින්නේදැයි සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන්නැයි පොලිස් රථවාහන අංශ ප්‍රධානියාට නියෝග කර තිබේ.

ඉහත වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියා පද වර්ග පිළිවෙළින් දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධාන ක්‍රියා
(2) විධාන ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
(3) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධාන ක්‍රියා
(4) පූර්ව ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධාන ක්‍රියා

18. පහත දී ඇති වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණ අංග පිළිවෙළින් දැක්වෙන පද පේළිය කුමක් ද?

රටපුරා විසිරී පවතින පුරා **විද්‍යාත්මක** ස්ථාන ආරක්ෂා කිරීම සඳහා සහාය ලබා ගැනීමට **කොමසාරිස්වරයා** විසින් **උපදේශක කමිටුවක්** පත් කරන ලදැයි මාධ්‍ය ප්‍රකාශකයා පැවසී ය.

(1) උක්ත කර්තෘ, අනුක්ත කර්තෘ, උක්ත කර්මය, අනුක්ත කර්මය
(2) අනුක්ත කර්මය, අනුක්ත කර්තෘ, උක්ත කර්මය, උක්ත කර්තෘ
(3) අනුක්ත කර්මය, උක්ත කර්තෘ, අනුක්ත කර්තෘ, උක්ත කර්මය
(4) අනුක්ත කර්තෘ, අනුක්ත කර්මය, උක්ත කර්මය, උක්ත කර්තෘ

19. සෞඛ්‍ය නිලධාරීහු සංචාරකයන් සෞඛ්‍ය පරීක්ෂාවට භාජනය කළහ.

ඉහත වාක්‍යය කර්මකාරකයට හැර වූ විට නිවැරදි වාක්‍යය වන්නේ මින් කුමක් ද?

(1) සෞඛ්‍ය නිලධාරීහු විසින් සංචාරකයෝ සෞඛ්‍ය පරීක්ෂාවට භාජනය කළ හ.
(2) සෞඛ්‍ය නිලධාරීන් විසින් සංචාරකයන් සෞඛ්‍ය පරීක්ෂාවට භාජනය කරන ලද හ.
(3) සෞඛ්‍ය නිලධාරීන් විසින් සංචාරකයෝ සෞඛ්‍ය පරීක්ෂාවට භාජනය කරනු ලැබූහ.
(4) සෞඛ්‍ය නිලධාරීන් විසින් සංචාරකයෝ සෞඛ්‍ය පරීක්ෂාවට භාජනය කෙරෙති.

20. පහත සඳහන් ගීත ඛණ්ඩයන්හි තද කළු අකුරින් මුද්‍රිත පද ව්‍යාකරණානුකූල ව හැඳින්වෙන නම් පිළිවෙළින් දැක්වෙන පද පේළිය කුමක් ද?

- **බෝධියෙන්** වට බෝ පතක් සේ සිනිඳු වැලි මළුවේ ........
- **නිවහල්** සිතුවිලි සිතනා සිතක් උදාරයි ..........
- **පෙරදිගමුතුඇටයයි** මේ ලෝකේ සිරිබර සිරිලංකා ..........
- **රුක්කත්තන** මල මුදුනේ බමරු නටන සැන්දෑවේ ............

(1) නිපාත, උපසර්ග, සමාස, සන්ධි
(2) නිපාත, සන්ධි, සමාස, උපසර්ග
(3) උපසර්ග, සන්ධි, නිපාත, සමාස
(4) නිපාත, සමාස, සන්ධි, උපසර්ග

21. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) 'හෝ' නිපාතය යොදා වාක්‍යයක කර්තෘ පද සම්බන්ධ කිරීමේ දී ආඛ්‍යාතයට ආසන්නම උක්ත පදය අනුව ක්‍රියාව යෙදෙයි.
(2) සමූහාර්ථ ප්‍රාණිවාචී පද වාක්‍යයක උක්තය වශයෙන් යෙදීමේ දී ආඛ්‍යාතය ඒක වචනයෙන් සිටී.
(3) අනියමාර්ථ ස්ත්‍රී ලිංග 'අක්' ප්‍රත්‍යයේ අනුක්ත රූපය 'එකු' හෝ 'අකු' වේ.
(4) ප්‍රධාන වාක්‍යයට සම්බන්ධ අසම්භාව්‍ය ක්‍රියාවක් සහිත අන්තර් වාක්‍යයේ කර්තෘ උක්ත රූපයෙන් සිටී.

● අංක **22** සිට **24** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

22. නව වසරක් උදාවද්දී පසුගිය වසරේ සිදු වූ වැදගත් සිදුවීම් ………… කිරීම සාමාන්‍ය සිරිතකි.
    (1) ආවර්තනය (2) ආරෝපණය (3) ආවර්ජනය (4) ආරෝහණය

23. කලාකරුවෙකු කිසියම් නිර්මාණයකින් රසිකයාට දීමට අපේක්ෂා කරන පණිවුඩය වටහා ගැනීමට නම් රසිකයා ද කිසියම් ………… ශක්තියකින් සමන්විත විය යුතු ය.
    (1) ප්‍රතිභාග (2) ප්‍රතිභාන (3) ප්‍රතිමාන (4) ප්‍රතිචාර

24. එම රෝගය වැළඳුණු රෝගීන්ගේ මියයාමේ ………… සියයට එකක් පමණ වන බව වෛද්‍ය විශේෂඥයන්ගේ මතයයි.
    (1) සම්බාධකය (2) සම්භාවිතාව (3) සම්පීඩනය (4) සම්භාෂණය

● අංක **25** සහ **26** ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

25. (1) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ පරීක්ෂකවරුන් තුන් දෙනෙක් සිටිති.
    (2) වෙසක් පොහෝ දිනය නිමිත්තෙන් සිරකරුවන් 180 දෙනෙකු නිදහස් කරන ලදී.
    (3) අත්අඩංගුවට ගත් පුද්ගලයා රණාල ප්‍රදේශයේ පදිංචි කරුවෙක් විය.
    (4) ධර්මශ්‍රවණයට බොහෝ පින්වත්තු පැමිණෙතැයි දායක සභාව අපේක්ෂා කරයි.

26. (1) රජ්ජුරුවෝ රජකම සිය දෙවූ පුතුට බාර දී වන ගත විය.
    (2) එක් එක් කණ්ඩායමට ක්‍රීඩකයන් දසදෙනෙකු බැගින් සිටිති.
    (3) මහනාහිමි රුස්වීමේ මුලසුන හොබවති.
    (4) ගීත රචකයෙක් හෝ ගීත රචකාවියක් සාකච්ඡාවට සහභාගී වූවා ය.

● අංක **27** සහ **28** ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

27. සද්ධර්මයේ **චිරස්ථිතිය** උදෙසා ධර්ම සංගායනාවක් පැවැත්විය යුතු බව රහතන් වහන්සේලාගේ ඒකමතික තීරණය විය.
    (1) සංශෝධනය (2) බොහෝකල් පැවැත්ම
    (3) අභිවෘද්ධිය (4) ආරක්ෂාව

28. තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් ධර්මඥානයෙන් **පාරප්‍රාප්ත වී** සිටි බව පංචිකාප්‍රදීපයෙන් හෙළි වේ.
    (1) සම්ප්‍රාප්ත වී (2) පරිශුද්ධ වී (3) පරතෙරට පත් වී (4) පරිණාමය වී

● අංක **29** සහ **30** යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස තෝරන්න.

29. කතරගම ගිහින් කිරිවෙහෙර නොදැකීම
    (1) කතරගම දැනගෙන යා යුතු වීම
    (2) කිරිවෙහෙර පිහිටා ඇත්තේ කතරගම බව නොදැනීම
    (3) කතරගම යා යුත්තේ කිරිවෙහෙර දැකීමට බව
    (4) බලවත් අඩුපාඩුවක් සිදුවීම

30. කොට්ටෝරුවා කෙසෙල් ගසට කෙටීම
    (1) බලවතෙකු සමග පැටලී අමාරුවේ වැටෙන බව
    (2) කෙසෙල් ගසට කෙටීම පහසු බව
    (3) කෙසෙල් ගසේ හරයක් නැති බව
    (4) කොට්ටෝරුවා කෙසෙල් ගස නොහඳුනන බව

31. "ඔය නෝක්කාඩුව අහන්න වෙයි කියල එදා මම හූනා කියන්නා වාගෙ කිව්ව"
ඉහත ප්‍රකාශය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වාක්‍යය වන්නේ කුමක් ද?
(1) ඔය අපවාදය අසන්නට වෙතොත් ඒ එදින මා කී නිසා ය.
(2) ඔය අපවාදය අසන්නට වෙතැයි මා කී විට හූනා ද එය අනුමත කළේ ය.
(3) ඔය අපවාදය අසන්නට වෙතැයි මම එදින නොඅනුමානව ම කීවෙමි.
(4) හූනා කියන්නා සේ ම ඔය අපවාදය අසන්නට වෙතැයි මම සිතුවෙමි.

32. එකිනෙකට අනුරූප ලෙස වචන යුගල යෙදී ඇති පද පේළිය කුමක් ද?
(1) පුණ්‍ය තීර්ථය, පුස්තක නාමාවලිය, ජ්‍යෙෂ්ඨ සිසුවා, මහ ඔසු
(2) මාර්ග පිවිසුම, සෙල් පිළිම, දකුණු ප්‍රදේශය, මහ සාගරය
(3) ප්‍රධාන තැන, නාග ලෝකය, සුමධුර දෙසුම, කථා ව්‍යවහාරය
(4) රජ බොජුන්, ලෝක ශාසනය, පූර්ව යාමය, දින දසුන

33. මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) චංචල - සල, සසල, සන්සල, සෙලවෙන
(2) උපද්‍රව - උවදුර, අනතුර, විනාශය, ව්‍යසනය
(3) වර්ෂය - වසර, අවුරුද්ද, වස, වා
(4) ඊශ්වර - ඉසුරු, නායක, නා, ඊර්ෂ්‍යාව

34. මේ අතුරින් විරුද්ධාර්ථ පද යුගලයක් නොවන්නේ කුමක් ද?
(1) කුලීන - කුලහීන
(2) උපක්‍රමය - අපක්‍රමය
(3) උච්ච - නීච
(4) අභ්‍යන්තර - බාහිර

35. සමානාර්ථවත් යුගල පද ඇතුළත් වරණය කුමක් ද?
(1) අඩුම කුඩුම, ඇඟිරි බැඟිරි, ඉඩම් කඩම්, අඟර දඟර
(2) අබල දුබල, අතින් මිටින්, අරුම පුදුම, අවුල් වියවුල්
(3) සිරිත් විරිත්, කුඩු මහත්, ඕනෑ එපාකම්, දිවා රෑ
(4) ලට්ට ලොට්ට, වංහුං, අල්ල පනල්ලෙ, අනං මනං

36.
තිබඳ පැසී පල ලඹ දෙන මිහිරඹය
සුවඳ විහිද සිටි විලිකුන් කැන්රඹය
නොමඳ තැනින් තැන වටුබර වනරඹය
එමැද වෙහෙර දිලි දුරලන සසරබය

මේ කවියෙන් දැක්වෙන්නේ,
(1) රූපකාලංකාරයයි.
(2) උපමාලංකාරයයි.
(3) ස්වභාවෝක්ති අලංකාරයයි.
(4) අතිශයෝක්ති අලංකාරයයි.

37. විරිත A – වර්ණිත වස්තුවට හෝ අවස්ථාවට අනුගත ව සමාන ශබ්ද අකුරු හා පද නැවත නැවත යෙදීම

අනුප්‍රාසය B – අක්ෂර හෝ මාත්‍රා යොදා සංඛ්‍යාත්මක නියමයන්ට අනුව පාද ගැළපීම

රිද්මය C – එක් එක් පාදයෙහි මුල, මැද, අග වශයෙන් හෝ මුල අග වශයෙන් හෝ අග පමණක් හෝ සමාන අකුරු යෙදීම

එළිසමය D – කිසියම් තාලයකට අනුව අවස්ථෝචිත ව රස ජනනය කිරීම

රසය ඉස්මතු කිරීම සඳහා කවියා භාවිත කරන ඉහත කාව්‍යෝපක්‍රම හතරෙහි අර්ථ විග්‍රහයන්ගේ අනුපිළිවෙළ විය යුත්තේ මින් කුමක් ද?

(1) *A, B, C, D* (2) *B, A, D, C* (3) *B, A, C, D* (4) *A, D, C, B*

38. **සිසි** වන වුවන ඉඟ සුග ගත හැකි මිටින

**තිසි පුළුලුකුල රියසකයුරු තිසර** තන

දිසි රන ලියෙව් රූ සිරි යුත් මෙපුර ගන

ඇසි පිය හෙළන පමණින් නොවෙති දෙවඟන

ඉහත පද්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කාව්‍යෝපක්‍රම හැඳින්වෙන නම් අනුපිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?

(1) රූපක, උපමා, රූපක, උපමා (2) රූපක, රූපක, උපමා, උපමා

(3) උපමා, රූපක, උපමා, රූපක (4) උපමා, උපමා, රූපක, රූපක

39.
- පන්සිය පනස් ජාතක පොත, සිංහල ථූපවංශය, සිංහල බෝධි වංශය, අනාගත වංශය
- සිදත් සඟරාව, සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, එළු සඳැස් ලකුණ
- සද්ධර්මරත්නාකරය, කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍යය, බුදුගුණ අලංකාරය
- සද්ධර්මාලංකාරය, එළු අත්තනගලු වංශය, ශාසනාවතාරය, තිසර සන්දේශය

*A* – දඹදෙණි යුගය

*B* – කුරුණෑගල යුගය

*C* – ගම්පොළ යුගය

*D* – කෝට්ටේ යුගය

ඉහත සඳහන් විශේෂ ග්‍රන්ථ අයත් වන යුග අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.

(1) *A, B, C, D* (2) *B, A, D, C* (3) *B, D, C, A* (4) *C, D, B, A*

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන නිවැරදි වාක්‍යය තෝරන්න.

අනුරාධපුර යුගයේ නිර්මාණය කරන ලද සඳකඩපහණ සිංහල කැටයම්කරුගේ අද්විතීය කලා කෞශල්‍යය මනාව විදහා දක්වන කිසිකලක පරණ නොවන පරණ වුව ද නවතාවෙන් තොර නොවන අගනා සංස්කෘතික හා ජාතික වස්තුවකි.

(1) අනුරාධපුර යුගයේ නිර්මිත සඳකඩපහණ අද්විතීය සිංහල කැටයම්කරුගේ කලා කෞශල්‍යය මැනවින් විදහා දක්වන නවතාවෙන් පරණ නොවන අගනා සංස්කෘතික හා ජාතික වස්තුවකි.

(2) අනුරාධපුර යුගයේ නිර්මිත සඳකඩපහණ සිංහල කැටයම්කරුගේ පෞරාණික කලා කෞශල්‍යය විදහා දක්වන අගනා සංස්කෘතික හා ජාතික නවතම වස්තුවකි.

(3) අනුරාධපුර යුගයේ නිර්මිත සඳකඩපහණ පෞරාණික සිංහල කැටයම් කලාවේ අද්විතීය කලා කුශලතාව නවතාවෙන් පරණ නොවන අගනා සංස්කෘතික හා ජාතික වස්තුවකි.

(4) අනුරාධපුර යුගයේ නිර්මිත සඳකඩපහණ සිංහල කැටයම්කරුගේ විශිෂ්ටතම කලා කෞශල්‍යය මැනවින් විදහා දක්වන නවතාවෙන් යුතු පෞරාණික අගනා සංස්කෘතික හා ජාතික වස්තුවකි.


වගුව 2.1 ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 21. | 1 |
| 02. | 1 | 22. | 3 |
| 03. | 3 | 23. | 2 |
| 04. | 4 | 24. | 2 |
| 05. | 1 | 25. | 3 |
| 06. | 2 | 26. | 4 |
| 07. | 1 | 27. | 2 |
| 08. | 4 | 28. | 3 |
| 09. | 2 | 29. | 4 |
| 10. | 2 | 30. | 1 |
| 11. | 2 | 31. | 3 |
| 12. | 1 | 32. | 4 |
| 13. | 3 | 33. | 4 |
| 14. | 4 | 34. | 4 |
| 15. | 2 | 35. | 2 |
| 16. | 4 | 36. | 3 |
| 17. | 1 | 37. | 2 |
| 18. | 2 | 38. | 1 |
| 19. | 3 | 39. | 2 |
| 20. | 1 | 40. | 4 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01කි.

## 2.3 I ප්‍රශ්න පත්‍රයෙහි I කොටස සඳහා සාධනය

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021
01 - සිංහල - **I** පත්‍රය - **I** කොටස
ප්‍රශ්නවල පහසුතා දර්ශකය




(ප්‍රස්තාරය 2.1: (RD/16/5/MPF පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
අපේක්ෂකයන් වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇති 1 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.90කි.
එනම් 1 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 90%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව 1 ප්‍රශ්නයේ පහසුතාව 90%ක් ලෙස දැක්විය හැකිය.

වගුව 2.2 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 1 | 2 | 5.64 | 89.95 | 2.07 | 1.98 | 0.38 |
| 2 | 1 | 73.78 | 15.32 | 4.80 | 5.46 | 0.66 |
| 3 | 3 | 3.20 | 15.89 | 72.66 | 7.52 | 0.76 |
| 4 | 4 | 13.16 | 8.93 | 6.30 | 70.59 | 4.04 |
| 5 | 1 | 61.10 | 11.00 | 13.07 | 14.10 | 0.76 |
| 6 | 2 | 4.33 | 76.51 | 14.38 | 4.33 | 0.47 |
| 7 | 1 | 62.88 | 6.96 | 3.67 | 25.66 | 0.85 |
| 8 | 4 | 22.37 | 29.61 | 31.40 | 15.98 | 0.66 |
| 9 | 2 | 22.66 | 29.61 | 17.02 | 30.17 | 0.57 |
| 10 | 2 | 17.58 | 22.09 | 20.21 | 39.29 | 0.85 |
| 11 | 2 | 32.34 | 20.96 | 27.45 | 18.90 | 0.38 |
| 12 | 1 | 31.02 | 18.52 | 13.82 | 36.10 | 0.57 |
| 13 | 3 | 16.92 | 27.45 | 33.75 | 20.96 | 0.94 |
| 14 | 4 | 18.43 | 20.87 | 26.79 | 32.71 | 1.23 |
| 15 | 2 | 15.70 | 61.10 | 10.53 | 12.32 | 0.38 |
| 16 | 4 | 13.63 | 27.07 | 29.05 | 29.23 | 1.04 |
| 17 | 1 | 44.93 | 15.70 | 18.99 | 20.12 | 0.29 |
| 18 | 2 | 19.74 | 36.47 | 30.36 | 12.69 | 0.76 |
| 19 | 3 | 13.54 | 23.22 | 48.78 | 14.20 | 0.29 |
| 20 | 1 | 62.69 | 13.54 | 15.61 | 7.90 | 0.29 |
| 21 | 1 | 70.59 | 22.19 | 35.53 | 20.40 | 1.32 |
| 22 | 3 | 5.74 | 8.37 | 80.17 | 5.27 | 0.47 |
| 23 | 2 | 10.34 | 61.32 | 11.66 | 26.32 | 0.38 |
| 24 | 2 | 3.39 | 86.57 | 7.24 | 2.35 | 0.47 |
| 25 | 3 | 23.97 | 29.99 | 25.57 | 19.84 | 0.66 |
| 26 | 4 | 28.20 | 28.48 | 26.79 | 15.79 | 0.76 |
| 27 | 2 | 6.49 | 68.35 | 20.49 | 9.12 | 0.57 |
| 28 | 3 | 4.61 | 11.85 | 75.47 | 7.52 | 0.57 |
| 29 | 4 | 12.41 | 15.32 | 8.65 | 63.16 | 0.47 |
| 30 | 1 | 74.16 | 4.61 | 4.70 | 16.36 | 0.19 |
| 31 | 3 | 7.43 | 11.28 | 66.73 | 14.10 | 0.47 |
| 32 | 4 | 14.01 | 29.89 | 31.40 | 24.44 | 0.38 |
| 33 | 4 | 9.22 | 7.90 | 21.62 | 60.63 | 0.66 |
| 34 | 4 | 39.85 | 31.49 | 20.78 | 7.43 | 0.47 |
| 35 | 2 | 28.39 | 30.74 | 21.43 | 19.18 | 0.29 |
| 36 | 3 | 19.27 | 24.69 | 43.34 | 12.13 | 0.57 |
| 37 | 2 | 12.32 | 47.56 | 26.51 | 12.60 | 1.04 |
| 38 | 1 | 30.64 | 20.12 | 28.39 | 20.21 | 0.66 |
| 39 | 2 | 14.57 | 60.16 | 16.45 | 7.99 | 0.85 |
| 40 | 4 | 20.12 | 15.98 | 20.40 | 42.58 | 0.94 |


එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.
'Missing' තීරයේ දක්වා ඇත්තේ කිසිඳු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරාගත් හෝ අපේක්ෂක ප්‍රතිශතයයි.

## 2.4 I ප්‍රශ්න පත්‍රයේ I කොටස සඳහා තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

**වගුව 2.3 තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක**

| තේමාව / විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| භාෂා කුසලතා | 1,2,3,22,23,24,27,28,29,30,31,32,33,34,35 |
| ව්‍යාකරණ | 4,5,6,7,8,9,10,11,12,13,14,15,16,17,18,19,20,21,25,26 |
| සාහිත්‍ය දැනුම | 36,37,38,39 |
| විශ්ලේෂණය හා අවබෝධය | 40 |

I වන පත්‍රය බහුවරණ ප්‍රශ්න 40කි න් සමන්විත ය. ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කර ගත් තේමා සංඛ්‍යාව 4කි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය ඉහත වගුවේ සඳහන් කර ඇත. එක් එක් තේමාවට අදාළ මාතෘකා සහ විෂය කරුණු ප්‍රමාණය අනුව ප්‍රශ්න සංඛ්‍යාව තීරණය කර ඇත. ප්‍රශ්න 40න් 15ක් භාෂා කුසලතාව තේමාව යටතේ ද 20ක් ව්‍යාකරණ තේමාව යටතේ ද සාහිත්‍ය දැනුම තේමාව යටතේ ප්‍රශ්න 04ක් ද විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ ප්‍රශ්න 1ක් ද ඇතුළත් කර ඇත.




ප්‍රස්තාරය 2.2 (RD/16/5/MDF) ආකෘති පත්‍රයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී

බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව පිළිබඳ අපේක්ෂකයන් සතු නිරවුල් දැනුම, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිත ය.

මෙම බහුවරණ ප්‍රශ්න හතළිහට ම ඒ සඳහා විශේෂයෙන් සැකසුණු ආකෘතියක පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල I පත්‍රයට හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I පත්‍රයේ I කොටසෙහි ප්‍රශ්න හතළිහට පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත් පැය එකක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් යැයි අපේක්ෂා කෙරේ.

භාෂා කුසලතා

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් ප්‍රශ්න 15ක් භාෂා කුසලතා තේමාවෙන් ඉදිරිපත් කර ඇත. I පත්‍රයට හිමි ලකුණුවලින් 18%ක් මේ සඳහා වෙන් කෙරෙන ලෙස තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න 40න් පහසු ම ප්‍රශ්නය වූ පළමු ප්‍රශ්නය භාෂා කුසලතා තේමාවට ඇතුළත් වේ. එහි පහසුතාව 90%කි. පහසුතා දර්ශකයේ දෙවන උපරිම අගය පෙන්නුම් කරන්නේ ද භාෂා කුසලතාවට අයත් අංක 24 ප්‍රශ්නයයි. එහි පහසුතාව 87%කි. ප්‍රශ්න 40 අතුරෙන් ඉහළ ම පහසුතාව මෙම ප්‍රශ්න දෙක පෙන්නුම් කර ඇත. මෙම තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් පහසුතාව 50%ක් හෝ ඊට වැඩි ප්‍රශ්න සංඛ්‍යාව 12කි. එම ප්‍රශ්න වන්නේ 1, 2, 3, 22, 23, 24, 27, 28, 29, 30, 31, හා 33 ප්‍රශ්න වේ. අඩුම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ ද භාෂා කුසලතා තේමාවට අයත් අංක 34 ප්‍රශ්නයයි. එහි පහසුතාව 7%කි. එම තේමාව තුළ ඊළගට පහසුතාව අඩු අගයක් පෙන්නුම් කර ඇත්තේ අංක 32 ප්‍රශ්නයයි. එහෙත් එහි පහසුතාව 24%ක් වැනි තරමක් ඉහළ අගයක් පෙන්නුම් කර ඇත.

අවම පහසුතාවක් පෙන්වූ 34 ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වූ 4 වරණය තෝරා ගෙන ඇත්තේ 7%ක් පමණි. 1 වරණය 40%ක් ද 2 වරණය 31%ක් ද 3 වරණය 21%ක් ද වශයෙන් තෝරා ගෙන ඇත. විරුද්ධාර්ථවත් පද නිවැරදි ව හඳුනා ගෙන විරුද්ධාර්ථවත් නොවන පද යුගලය තේරීම අපේක්ෂාව වුව ද විරුද්ධාර්ථවත් පද පිළිබඳව පුළුල් අවබෝධයක් අපේක්ෂකයන් සතුව නොපැවති බව එයින් පිළිබිඹු වෙයි. පෙළපොත නිසි ලෙස පරිශීලනය නොකිරීමත් සතතාභ්‍යාසවල නොයෙදීමත් ඊට හේතු ලෙස දැක්විය හැකි ය.

ව්‍යාකරණ

සිංහල I පත්‍රයේ I කොටසෙහි ව්‍යාකරණ තේමාවට බහුවරණ ප්‍රශ්න 20ක් අන්තර්ගත වූ අතර මෙම ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණුවලින් 24%ක් එම තේමාවට වෙන් කර ඇත. ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න 20 අතුරෙන් පහසුතාව වැඩි ම ප්‍රශ්නය 6 ප්‍රශ්නයයි. එහි පහසුතාව 77%කි. 6 ප්‍රශ්නය හැරුණු කොට මෙම තේමාවට ඇතුළත් පහසු ප්‍රශ්න වන්නේ 4, 5, 7, 15, 20යන ප්‍රශ්නයි. ඒවායේ පහසුතාව පිළිවෙළින් 71%, 61%, 63%, 61% හා 63% වශයෙන් වේ.

ව්‍යාකරණ තේමාව යටතේ අපේක්ෂකයන්ට දුෂ්කර ම ප්‍රශ්න වී තිබුණේ 8 හා 26 ප්‍රශ්නයි. එම ප්‍රශ්න දෙකෙහිම පහසුතාව 16%කි. එම ප්‍රශ්න දෙක අතුරෙන් 8 ප්‍රශ්නයෙහි නිවැරදි වරණය වූයේ 4 වරණය වුවත් එය තෝරා ගෙන ඇත්තේ 16%ක් පමණි. 1 වරණයට 22%ක් ද දෙවන වරණයට 30%ක් ද 3වෙනි වරණයට 31%ක් ද වශයෙන් ප්‍රතිචාර දක්වා ඇත.

අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තේරීම සඳහා දී තිබූ 8 ප්‍රශ්නයට දක්වා ඇති ප්‍රතිචාර අනුව පැහැදිලි වන්නේ අක්ෂර වින්‍යාසය පිළිබඳ අයදුම්කරුවන්ට නිසි ප්‍රාගුණ්‍යයක් නැති බවයි. ඒ සඳහා සෑම ලේඛන කාර්යයක දී ම ශිෂ්‍යයන් දැනුවත් කිරීමත් සතතාභ්‍යාසයත් අත්‍යවශ්‍ය බව අවධාරණය කෙරේ.

ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තේරීම සඳහා වූ 26 ප්‍රශ්නයේ නිවැරදි වරණය 4 වුවත් ඊට ප්‍රතිචාර දක්වා ඇත්තේ 16%ක පිරිසකි. ආසන්නව 28%ක් බැගින් වූ අපේක්ෂකයන් පළමු හා දෙවන වරණ වලට ද 27%ක් තුන්වන වරණයට ද ප්‍රතිචාර දක්වා ඇත. ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තේරීම සඳහා ව්‍යාකරණ රීති පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් අයදුම්කරුවන් සතුව නොපැවති බව ඉන් පැහැදිලි වේ. සමස්තයක් වශයෙන් ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා ගැනීමේ දී සාමාන්‍ය පහසුතාව (Average Facility) 40%ක වැනි සතුටුදායක තත්ත්වයක පැවතිණි.

## සාහිත්‍යය දැනුම

සිංහල 1 ප්‍රශ්න පත්‍රයේ 1 කොටසෙහි ප්‍රශ්න 40 අතුරෙන් මෙම තේමාව ඇසුරෙන් සකස් වී ඇත්තේ ප්‍රශ්න 4ක් පමණි. එනම් 36, 37, 38 හා 39 ප්‍රශ්නයි. මෙම ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩි ම අංක 39 ප්‍රශ්නයෙහි පහසුතාව 60%කි. 36, 37, 38 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 43%, 48% හා 31%ක් වේ. පෙළපොතේ ඇතුළත් කාව්‍යාලංකාර හා සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම විමසා බැලීම මෙම ප්‍රශ්නවලින් අපේක්ෂිත විය.

සාහිත්‍යය ඉතිහාසය පිළිබඳ දැනුම විමසන ලද 39 ප්‍රශ්නයට මනා ප්‍රතිචාරයක් ලැබී තිබුණ ද කාව්‍යාලංකාර පිළිබඳ අවබෝධය මඳ වීම සෙසු ප්‍රශ්න සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලැබීමට හේතු වී ඇත. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු ප්‍රමාණයෙන් 10%ක් සාහිත්‍ය දැනුම තේමාවට වෙන් කර තිබුණි.

## විශ්ලේෂණය හා අවබෝධය


සිංහල I පත්‍රයේ විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ අංක 40 ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි. I පත්‍රයට හිමි ලකුණුවලින් මෙම තේමාව සඳහා 2.5%ක බර තැබීමක් සිදු කර ඇත. එම ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 43%කි. හොඳින් කියවා තේරුම්ගෙන පිළිතුරු ලිවිය යුතු වූ එම ප්‍රශ්නයට 50%ට අඩු පහසුතාවක් ලබා ගැනීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. විශ්ලේෂණය හා අවබෝධතා හැකියාව මැනීමේ ප්‍රශ්නයක් වන මෙහි පහසුතාව මෙන්ම සාමාන්‍ය පහසුතාව ද 43%කි.

සිංහල I ප්‍රශ්න පත්‍රයේ සමස්ත පහසුතාව 49%කි. එනම් මෙම පත්‍රයට පෙනී සිටි අපේක්ෂකයන් සමස්තයක් වශයෙන් ගත් කළ ඔවුන් උපයා ගෙන ඇත්තේ එම පත්‍රයට උපයා ගත හැකිව තිබූ උපරිම ලකුණුවලින් 49%කි. මෙයින් පෙනී යන්නේ මෙම පත්‍රයට ලකුණු ලබා ගැනීම මධ්‍යස්ථ මට්ටමක පැවති බවයි.

සිංහල I පත්‍රයේ ප්‍රශ්න අංක 1, 2, 3, 4, 5, 6, 7, 15, 20, 22, 23, 24, 27, 28, 29, 30, 31, 33, 39 යන ප්‍රශ්න 19 සඳහා සාමාන්‍ය පහසුතාව 68%කි. ඒ අනුව මුළු ප්‍රශ්න ගණනින් 47%ක් සඳහා 50%ට වැඩි පහසුතාවක් ලබා ගැනීම සතුටුදායක තත්ත්වයකි. එම ප්‍රශ්න 19න් 12ක් භාෂා කුසලතා තේමාව වෙනුවෙන් ද ප්‍රශ්න 6ක් ව්‍යාකරණ තේමාව වෙනුවෙන් ද ප්‍රශ්න 01ක් සාහිත්‍ය දැනුම තේමාවට ද ඇතුළත් වේ. සමස්ත පහසුතාව 49%ක තරම් මධ්‍ය අගයකට ආසන්නව පැවතීම සතුටුදායක තත්ත්වයකි.

සිංහල භාෂා ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී භාෂා කුසලතාව හා ව්‍යාකරණ සිද්ධාන්ත පිළිබඳ මනා ප්‍රාගුණ්‍යයක් ලබා ගැනීම සඳහා පෙළපොතට අතිරේක ව බාහිර පොතපත පරිශීලනය, භාෂා දින පැවැත්වීම, භාෂා ඥානය කුළු ගැන්වීමේ තරග පැවැත්වීම ආදී ක්‍රියාකාරකම් ගුරුශිෂ්‍ය දෙපිරිසට ම යෝජනා කෙරේ.

## 2. 5 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටසෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





**ප්‍රස්තාරය 2.3** (RD/16/02/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: සිංහල I පත්‍රයෙහි II කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. මෙම ප්‍රස්තාරයට අනුව අංක 1 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 99.33%කි. අඩු ම අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරා ගෙන ඇත්තේ 5 ප්‍රශ්නය වන අතර එය ප්‍රතිශතයක් ලෙස 82.89%කි.

## 2.6 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටසෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය




**ප්‍රස්තාරය 2.4** (RD/16/02/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී)


මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත දැක්වෙන උදාහරණයෙන් පෙන්වා දී ඇත.

මෙහි පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් ද දෙවන ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් ද තෙවන හා හතරවන ප්‍රශ්න සඳහා ලකුණු 10ක් බැගින් ද පස්වන ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් ද ලබා දී ඇත. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

පළමුවන ප්‍රශ්නය සඳහා 14.32%ක අපේක්ෂකයන් පිරිසක් 51- 75% ලකුණු ප්‍රාන්තරයේ එනම් ලකුණු 11-15 අතර ලබාගෙන ඇත. 0-25% අතර ලකුණු ප්‍රාන්තරයේ එනම් ලකුණු 0-5ත් අතර ලකුණු ලබා ඇති අපේක්ෂක ප්‍රතිශතය 50.34%කි.

(මෙම එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ඉදිරි පිටුවල අන්තර්ගත වේ.)

## 2.7 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටස සඳහා සාධනය




**ප්‍රස්තාරය 2.5**

අපේක්ෂකයන් වැඩි ම පිරිසක් සාර්ථක ව පිළිතුරු සපයා ඇති 4(i) ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.90කි. එනම් 4(i) ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් 90%ක් සාර්ථක ව පිළිතුරු සපයා ඇත. ඒ අනුව ප්‍රශ්නයේ පහසුතාව 90%ක් ලෙස දැක්විය හැකිය. 1 (අ) අනුකොටස සඳහා අපේක්ෂකයන් අවම පිරිසක් සාර්ථක ව පිළිතුරු සපයා ඇති අතර එහි පහසුතා දර්ශකය 0.06කි.

## 2.8 I ප්‍රශ්න පත්‍රයෙහි II කොටස සඳහා එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබා දීමේ පටිපාටිය

1 ප්‍රශ්නය

අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම

ව්‍යුහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුප්‍රශ්න 10ක් ඇතුළත්වේ.

අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

**1.** අංක **(i)** සිට **(x)** තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) පහත සඳහන් අක්ෂර, අක්ෂර උත්පත්තිස්ථාන අනුව හැඳින්වෙන නම් ලියන්න.

(අ) ශ (ආ) ෂ

(ii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) තම අදහස් අනුව පමණක් ක්‍රියා කරන

(ආ) අන්‍යයන්ගෙන් පීඩා ලද

(iii) පහත සඳහන් පද්‍ය පාඨ දෙකෙහි එන 'බල' යන්නෙහි අර්ථ දෙක වෙන වෙන ම ලියන්න.

බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන

(අ) බල (පිරි සෙන්)

(ආ) බල

(iv) (අ) තරුණ යන්නට 'ය' ප්‍රත්‍යය එක්වීමෙන් 'තාරුණ්‍ය' සෑදෙන්නා සේ අධිපති යන්නට 'ය' ප්‍රත්‍යය එක් වීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?

(ආ) සත් + ත්ව එක් වීමෙන් සෑදෙන තද්ධිත පදය ලියන්න.

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) ස්ථාවර (ආ) ආගමන

(vi) පහත දැක්වෙන පද දෙකේ අනුක්ත රූප ලියන්න.

(අ) පදිකයෙක් (ආ) හෙදියක්

(vii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

පවත්නා යුදමය අර්බුධ හමුවේ ඌණ සංවර්ධිත රටවලට ප්‍රශ්න රාශියකට මුහුණ පෑමට සිදු වෙතැයි ආර්ථික විශේෂඥයෝ අනතුරු අඟවති.

(viii) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍යය කර්මකාරකයටත්, කර්මකාරක වාක්‍යය කර්තෘකාරකයටත් හරවා ලියන්න.

(අ) උත්සව සංවිධායකයෝ ආරාධිත අමුත්තා වේදිකාව වෙත කැඳවාගෙන ගියහ.

(ආ) දේශකයා විසින් ලක්දිව වාරි තාක්ෂණය පිළිබඳ හරවත් දේශනයක් පවත්වන ලදි.

(ix) පහත දැක්වෙන යෙදුම්වල පළමු වචනය සහ දෙවන වචනය අතර නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.

(අ) නිෂ්ඵල වෑයම (ආ) දහම් ආලෝකය

(x) පහත සඳහන් පද්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද කවර ක්‍රියා වර්ගයට අයත් දැයි දක්වන්න.

(අ) කියත උන් මෙතෙපල
ආයෙය ඇදුරු ගුත්තිල

(ආ) වැඳ ඔහු පද කමල
තමා ආ තතු කීය මුසිල

පිළිතුරු

(i) (අ) තාලුජ ශ යන්න (ආ) මූර්ධජ ෂ යන්න

(ii) (අ) අත්තනෝමතික (ආ) පරපීඩිත

(iii) (අ) බලවත් / ශක්තිමත් (ආ) බලන්න / බලව / බලනු මැනව

(iv) (අ) ආධිපත්‍ය / ආධිපත්‍යය (ආ) සත්තව / සත්තව

(v) (අ) ජංගම / අස්ථාවර (ආ) විගමන

(vi) (අ) පදිකයෙකු / පදිකයෙකු (ආ) හෙදියක

(vii) (අ) අර්බුද (ආ) ඌන

(viii) (අ) උත්සව සංවිධායකයන් විසින් ආරාධිත අමුත්තා වේදිකාව වෙත කැඳවා ගෙන යන ලදි/ යනු ලැබීය / යැවිණි.

(ආ) දේශකයා ලක්දිව වාරි තාක්ෂණය පිළිබඳ හරවත් දේශනයක් පැවැත්වි ය / පැවැත්තුවේ ය / පැවැත්වී.


(ix) (අ) නිෂ්පල ව්‍යායාමය / පල රහිත වෑයම

(ආ) දහම් එළිය / දම් එළිය / ධර්ම ආලෝකය / ධර්මාලෝකය

(x) (අ) කියත - අසම්භාව්‍ය ක්‍රියා / කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා / කල් අරුත් අසබහව්කිරිය / නියතාර්ථයේ අවස්ථික ක්‍රියා

(ආ) පූර්ව ක්‍රියා / පෙර කිරිය

### 2.8.1 I ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන , හා යෝජනා





ප්‍රස්තාරය **2.6 (a)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. අපේක්ෂකයන් 99%ක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු,

0 - 5 ප්‍රාන්තරයේ 50%ක් ද
6 - 10 ප්‍රාන්තරයේ 34%ක් ද
11 - 15 ප්‍රාන්තරයේ 14%ක් ද
16 - 20 ප්‍රාන්තරයේ 2%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 2%ක් වන අතර 50%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය **2.6 (b)**

සිංහල 1 පත්‍රයේ II කොටසෙහි පළමු ප්‍රශ්නය කොටස් 10ක් යටතේ අනුකොටස් 20කින් සමන්විත වේ. වැඩි ම පහසුතාව iv (අ) අනුකොටස වන අතර එහි පහසුතාව 70%කි. මෙම ප්‍රශ්නයෙන් මැනෙන්නේ භාෂා භාවිතය පිළිබඳ පරිචයයි. එහි දී අධිපති යන පදයට 'ය' ප්‍රත්‍යය එක්වීමෙන් සෑදෙන තද්ධිත පදය නිවැරදි ව දැක්වීමට අපේක්ෂකයන්ගෙන් අඩකට මඳක් වැඩි ප්‍රමාණයක් සමත් වී ඇත.

දෙවන වැඩි පහසුතාව වන 65% පෙන්නුම් කර ඇත්තේ (v) කොටසේ (අ) අනුකොටසට ය. විරුද්ධාර්ථ පද භාවිතය පිළිබඳව මෙම ප්‍රශ්නයේ අනුකොටස් දෙකෙන් ම විමසා ඇති අතර නිතර භාවිතයේ පවත්නා පද පිළිබඳ ව විමසා ඇති බැවින් එම ප්‍රශ්නය පහසු වී ඇති බව පෙනේ.

තෙවන වැඩිම පහසුතාව (i) (අ) අනුකොටස වන අතර එහි පහසුතාව 43%කි. අක්ෂර උත්පත්ති ස්ථාන අනුව හැඳින්වෙන නම් විමසන ප්‍රශ්නයකි. අක්ෂර හඳුන්වන නම් නිවැරදිව ප්‍රකාශ කිරීමට අපේක්ෂයන්ගෙන් අඩකට අඩු පිරිසක් සමත්ව ඇත.

I (ආ), III (අ) (ආ), IV (ආ), V(ආ), VI (අ) (ආ), X (ආ) යන කොටස්වල / අනුකොටස්වල පහසුතාව 30% - 40% ප්‍රාන්තර අතර පවතී. මෙම අනුකොටස් 20 අතුරෙන් දුෂ්කර ම වී ඇත්තේ X (අ), IX (අ), II (අ) අනුකොටස්ය. එම අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් 6%, 8%, 9%ක් වේ. ඒ අනුව X (අ) ක්‍රියා පද පිළිබඳ අවබෝධයත් IX (අ) සහ II (අ) අනුකොටස්වලින් භාෂා හැකියාව පිළිබඳ අවබෝධයත් මැනෙන අතර ඒ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් අපේක්ෂකයන් සතුව නොතිබීම ඉහත අනුකොටස්වලට සාර්ථක ව පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් අපොහොසත් වීමට හේතු ලෙස අවධාරණය කළ හැකිය.

අනතුරුව වඩාත් දුෂ්කර වී ඇත්තේ II (ආ) අනුකොටසයි. එහි පහසුතාව 14%කි. එහි (අ) අනුකොටසේ පහසුතාව 9%කි. එම අනුකොටස් දෙකෙන් ම මැනෙනුයේ තනි පද ලිවීම පිළිබඳ අවබෝධයයි. ඒ අනුව භාෂා කුසලතා පිළිබඳ අපේක්ෂකයන් සතු අවබෝධය දුර්වල මට්ටමක පවතින බව අනාවරණය විය.

(VIII) කොටසේ අනුකොටස් දෙකෙන් ම මැනෙනුයේ කාරක භේදයයි. එහි (අ) සහ (ආ) අනුකොටස් සඳහා පහසුතාව පිළිවෙළින් 23%ක් සහ 20%ක් වේ. එමෙන් ම (VII) කොටස ද අඩු පහසුතාවක් පෙන්නුම් කරන ප්‍රශ්නයකි. එම කොටසේ අනුකොටස් දෙක සඳහා පහසුතාව පිළිවෙළින් 27%ක් හා 19%ක් වේ. මෙම අනුකොටස් දෙකෙන් මැනෙනුයේ අක්ෂර වින්‍යාසය පිළිබඳව දැනුමකි.

## 2 ප්‍රශ්නය

අපේක්ෂණය : සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැනීම

ව්‍යූහය : මාර්ගෝපදේශිත රචනා මූලධර්මයට අනුව සැකසී ඇති මෙම ප්‍රශ්නය සඳහා ඉදිරිපත් කොට ඇති මඟ පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලසේ.

**2.** පහත දැක්වෙන (i), (ii), (iii) හා (iv) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන, වචන **250** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අංකය ඔබේ උත්තර පත්‍රයේ ලියා, රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. *(ලකුණු 25 යි)*

(i) කොවිඩ් වසංගතය හමුවේ ලොව බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද උග්‍ර ආර්ථික ප්‍රශ්නවලට මුහුණ පා තිබේ. එනිසා අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල විශේෂයෙන් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් දරා ගත නොහැකි මට්ටමට ඉහළ ගොස් ඇත. අපට හැකි ආකාරයෙන් ගෙවතු වගා කොට වැඩිවන ජීවන වියදම අවම කර ගැනීමට කාගේත් අවධානය යොමු වෙතොත් එය ජාතියේ වාසනාවකි. කෘෂිකාර්මික රටක් වශයෙන් ඒ සඳහා සියලු භෞතික හා පාරිසරික සාධක අප සතුව ඇති බැවින් සෑම බිම් අඟලක් ම වගා කටයුතුවලට යොදාගත යුතු ය. රට ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා ගොඩ නැංවීමට හැකිවන්නේ එමගින් පමණි.

(ii) බලශක්ති ප්‍රශ්නයට අද අප රට බලවත් ලෙස මුහුණ පා සිටී. ඛනිජතෙල් හා ජල විදුලි බලය ප්‍රධාන බලශක්ති ප්‍රභවයන් දෙක වුව ද ඛනිජතෙල් මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම හා දිය ඇලි හා ජලාශ සිඳීයාම මීට හේතු වී තිබේ. සූර්ය බලශක්තිය, ජීව වායු බලය, මුහුදු රළ හා සුළං බලය, තාප විදුලි බලය විකල්ප බලශක්ති ප්‍රභවයන් ය. අඩු පිරිවැයක් දරා නිපදවා ගත හැකි විකල්ප බලශක්ති ප්‍රභවයන් කෙරෙහි අවධානය යොමු කිරීම කාලෝචිත ය.

(iii) සාමකාමී ලෝකයක් ගැන කතා කරන ලෝක බලවත්තු ම අති නවීන යුද්ධායුධ නිෂ්පාදනය කර තම දේශපාලන න්‍යාය ධර්මයන්ට සෙසු රටවල් නතු කර ගැනීමේ බලලෝභී ක්‍රියාදාමයක යෙදී සිටිති. ලෝක ජනතාවගේ එක ම අභිලාෂය යුද්ධවලින් තොර සාමකාමී හා සහනශීලී ලෝකයක ජීවත්වීමයි. බලකාමයෙන ඉවත්ව සමස්ත ලෝකයම සුන්දර වාසභවනයක් බවට පත් කිරීම ලෝක බලවතුන්ගේ හා ජගත් සංවිධානවල අරමුණ විය යුතු ය.

(iv) 60 දශකයේ සිදු වූ කෘෂිකාර්මික විප්ලවයත් සමග රසායනික පොහොර හා පළිබෝධනාශකවලට හුරු වූ ගොවීහු බෝග හානිවලට ක්ෂණික විසඳුම් ලැබීම හා වැඩි අස්වැන්නක් ලැබීම නිසා අතිශයින් සතුටු වූහ එහෙත් එමගින් උදාකළ දීර්ඝකාලීන පාරිසරික හා සෞඛ්‍යමය ගැටලු නිසා වර්තමානයේ අපි පීඩා විඳිමින සිටිමු. හවබෝග රසායනික විසඳුම්වලට හුරු වී තිබීම, පස විනාශ වීම, බෝග හානිවලට ක්ෂණික විසඳුම් නොලැබීම වැනි අභියෝග හමුවේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික නැඹුරුවකට ගොවීන් නැවත යොමු කිරීම පහසු නොවේ. එහෙත් එය ජය ගතහොත් එය සුබ පෙර නිමිත්තකි.

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබා දීමේ පටිපාටිය

2. රචනය (මුළු ලකුණු 25යි)

- සංස්ලේෂණ හැකියාව හෙවත් සමස්තයක් ගොඩනැගීමේ හැකියාව හා ජේදයක විවිධ කොටස් හඳුනාගෙන ඒ අනුකොටස් අතර නිවැරදි සම්බන්ධතාව පවත්වා ගනිමින් අලුත් යමක් නිර්මාණය කිරීමේ හැකියාව මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ.

- රචනා සඳහා ප්‍රධාන මග පෙන්වීම් හතරක් පහත සඳහන් තේමා යටතේ ඉදිරිපත් කොට ඇත.
  1. කොවිඩ් වසංගතයෙන් වැටුණු ආර්ථිකය ගොඩ නැංවීමට ගෙවතු වගාවෙන් දායක වෙමු
  2. බලශක්ති අර්බුදයට පුනර්ජනනීය විකල්ප බලශක්ති ප්‍රභවයන් පණ ගන්වමු
  3. ලෝක සාමය උදෙසා මහබලවතුන් හා ජගත් සංවිධාන සතු වගකීම
  4. සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රමවලට ගොවීන් හුරු කිරීමෙහි ලා මුහුණ පාන අභියෝග

- ලකුණු ප්‍රදානය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු

| | | |
|---|---|---|
| 1. | සාරවත්භාවය (මාතෘකාව ද ඇතුළුව) | ලකුණු 12යි |
| 2. | රචනා ශෛලිය හා භාෂා විලාසය | ලකුණු 08යි |
| 3. | ශිල්පීය දක්ෂතා | ලකුණු 05යි |

1. මාතෘකාව - ලකුණු 01යි


සාරවත්භාවය - ලකුණු 11යි

සාරවත්භාවය යටතේ
- තේමාවට අදාළ බව
- ඉදිරිපත් කර ඇති ව්‍යූහයට සමීප බව
- සාරවත් බව
- වචන ගණන 250ට සමීපව තිබීම ආදිය සැලකිල්ලට ගත යුතු ය. වචන 200ට අඩු නම් ලකුණු 1ක් ද 300ට වැඩි නම් ලකුණු 1ක් ද අඩු කරන්න.

2. රචනා ශෛලිය හා භාෂා විලාසය - ලකුණු 08යි
- උසස් ප්‍රකාශන ශක්තිය
- නිර්මාණාත්මක අදහස්
- ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදිය පිළිබඳ මෙහි දී සැලකිලිමත් විය යුතු ය

3 ශිල්පීය දක්ෂතා - ලකුණු 05යි
- වියරණ
- අත් අකුරු
- විරාම ලක්ෂණ
- පද බෙදීම
- සුදුසු පරිදි ජේද වෙන් කිරීම ආදිය පිළිබඳ මේ යටතේ අවධානයට ලක් විය යුතුය

### 2.8.2 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය **2.7 (a)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 95%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ. ඉන්,

0 - 6 ප්‍රාන්තරයේ 7%ක් ද
7 - 12 ප්‍රාන්තරයේ 36%ක් ද
13 - 18 ප්‍රාන්තරයේ 49%ක් ද
19 - 25 ප්‍රාන්තරයේ 9%ක් ද

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 43%කි. 13- 18 අතර ලකුණු ලබාගත් ප්‍රතිශතය 49%කි. 19 - 25 අතර ලකුණු ලබාගත් ප්‍රතිශතය 9%කි. සමස්තයක් වශයෙන් ගත් කල රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම සාධනීය මට්ටමක පවතී.




ප්‍රස්තාරය **2.7 (b)**

මෙම ප්‍රශ්නයෙහි I , II , III , IV පිළිවෙළින් "කොවිඩ් වසංගතයෙන් වැටුණු ආර්ථිකය ගොඩනැංවීමට ගෙවතු වගාවෙන් දායක වෙමු", "බලශක්ති අර්බුදයට පුනර්ජනනීය විකල්ප බලශක්ති විභවයන් පණ ගන්වමු", "ලෝක සාමය උදෙසා මහ බලවතුන් හා ජගත් සංවිධාන සතු වගකීම", "සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රම වලට ගොවීන් හුරු කිරීමෙහි ලා මුහුණපාන අභියෝග" යන මාතෘකා තේමා කර ගනිමින් මාර්ගෝපදේශ රචනා සඳහා විස්තරාත්මක ව්‍යුහගත ඡේද හතරක් ඉදිරිපත් කර තිබුණි. ඒවායින් පහසුතාව වැඩිම රචනා මාතෘකාව වූයේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රමවලට ගොවීන් හුරු කිරීමෙහි ලා මුහුණපාන අභියෝග යන මාතෘකාවයි. සාරවත්භාවය, රචනා ශෛලිය හා භාෂා විලාසය, ශිල්පීය දක්ෂතා සඳහා පහසුතාව පිළිවෙළින් 57%, 59% 58% වශයෙන් වන අතර පහසුතාව අඩුම "බලශක්ති අර්බුදයට පුනර්ජනනීය විකල්ප බලශක්ති ප්‍රභවයන් පණ ගන්වමු" යන මාතෘකාව යටතේ ඉහත කොටස් තුන සඳහා පහසුතාව පිළිවෙළින් 48%, 50% හා 48% වශයෙන් වෙයි.

(i) සහ (iii) මාතෘකා සඳහා සමස්ත පහසුතාව 50%ක් හෝ ඊට වැඩි වන අතර සමස්තයක් වශයෙන් අපේක්ෂකයන්ගේ අදහස් නිර්මාණාත්මකව, සංවිධානාත්මක ව, නිරවුල් ව හා ව්‍යාකරණානුකූල ව ඉදිරිපත් කිරීමට තව දුරටත් යොමු කිරීම සුදුසු ය.

මාර්ගෝපදේශයේ කරුණු ඉදිරිපත් කර ඇති රටාව සැලකිල්ලට ගැනීමෙන් මාතෘකාව හඳුනා ගැනීමටත් රචනා සැකිල්ලක් යටතේ කරුණු සංවිධානය කර ගැනීමටත් අපේක්ෂකයන්ට අවස්ථාව සැලසේ. වචන සංඛ්‍යාව 250කට නො අඩු යන සීමාව නිසා රචනාව වචන 250 - 300 අතර පවත්වා ගැනීමට අවකාශ සැලසේ.

අතිරේක පොතපත කියවීම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පරිශීලනය විශේෂයෙන් අන්තර්ජාලය ඇසුරෙන් නව ලෝකය පිළිබඳ දැනුම පුළුල් කර ගැනීම සාර්ථක රචනා කුසලතාවක් නිර්මාණය කර ගැනීමට මහඟු අත්වැලක් කර ගත හැකි ය.

දී ඇති රචනා ව්‍යුහ අතුරෙන් අපේක්ෂකයන්ට මග පෙන්වීමක් වශයෙන් (iii) මාතෘකාව යටතේ රචනා ආදර්ශයක් මෙහි දී ඇත.

ආදර්ශ රචනාව

**ලෝක සාමය උදෙසා මහ බලවතුන් හා ජගත් සංවිධාන සතු වගකීම**

ලෝකයේ කිසියම් තැනක යුද්ධයක් හෝ වෙනත් ගැටුම්කාරී තත්ත්වයකින් තොර දිනයක් සොයා ගත නොහැකි තරම් ය. ආර්ථික ශක්තියෙන් සමෘද්ධිමත් ව බලවත් වූ රටවල නායකයෝ සිය දේශපාලන න්‍යාය ධර්මයන්ට සෙසු රටවල් අවනත කරවා ගැනීමට මහත් තැතක් දරති. එය සාමකාමී අන්දමින් සිදු නොවන විට බලය යොදා ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යුධ ගැටුම් හට ගනී. රුසියාව හා යුක්රේනය අතර ඇති වී තිබෙන යුදමය තත්ත්වය එවැන්නකි. නවීන විනාශකාරී අවි ආයුධ නිෂ්පාදනය කරන්නේ ද මෙම ලෝක බලවතුන් ය. අවි ආයුධ අලෙවි කොට සිය ආදයම් තර කර ගැනීමට නම් ලෝකයේ කිසියම් තැනක යුධ ගැටුමක් පැවතිය යුතු ය. මෙසේ ලෝකයේ තැන තැන යුද ගැටුම් ඇති කරවීමට කුමන්ත්‍රණය කරන්නෝ ද ඔවුහු ය. එසේ ගැටුම් ඇති කොට ආයුධ අලෙවියෙන් ඔවුහු ආර්ථික අතින් පොහොසත් වෙනවා මෙන් ම යුද්ධාධාර දීමෙන් ඇතැම් විට ණයට සැපයීමෙන් එම රටවල් සිය දේශපාලන න්‍යාය ධර්මයන්ට නතු කරවා ගනිති.

ඒ අනුව බලය හා ශක්තිය යුක්තිය විසඳා ගැනීමට යොදා ගන්නා තිරශ්චීන පිළිවෙත මානව සමාජය තුළ 21වන සියවස තුළ වුව ද ක්‍රියාත්මක වන බව පැහැදිලිය. ලෝක ජනතාවගේ එකම පැතුම සාමයෙන් සහජීවනයෙන් යුක්ත ව ජීවත් වීමේ අභිලාෂයයි. එහෙත් ඒ සඳහා ලෝක බලවත්හු ඉඩ නොතබති. සාමකාමී ලොවක් තුළ ඔවුන්ට පැවැත්මක් නැත. එබැවින් ඒ සඳහා මග සලසනු වස් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජගත් සංවිධාන, කලාපීය සංවිධාන රැසක් බිහි වී ඇත. එහෙත් ඒවා පිහිටුවීමේ දී ඇති කර ගත් අරමුණු ක්‍රියාත්මක වීමේ දී ඉටු නොවේ. බොහෝ සංවිධානවල ප්‍රධානත්වය හිමි වන්නේ ද ලෝක බලවතුන්ට ය. ඔවුහු ලෝක සාමයට හා සහජීවනය ප්‍රධාන කොට ගත් සුභවාදී සංකල්ප ලෝකයට දේශනා කරමින් වෙනත් මාර්ගවලින් අන්තර්ජාතික ගැටුම් ඇති කරවති. ඒ මගින් අවි ආයුධ නිෂ්පාදනයටත් අලෙවියටත් මං පාදා ගනිති.

ලෝක ප්‍රජාවට අත් වී ඇති ඉරණම පිළිබඳ ව අප ගැමියන් අතර පවත්නා ආප්තෝපදේශය මෙහි දී අපට සිහිපත් කරවයි. "වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසමු ඒ අමාරුව". එබැවින් සුරක්ෂිත සාමකාමී අනාගත ලෝකයක් මතු පරපුර සඳහා බිහි කිරීමට නම් තිබෙන ජගත් සංවිධාන විසුරුවා හැර සියලු රටවල් නියෝජනයෙන් යුත් නවීනතම ජගත් සංවිධානයක් බිහි කිරීමත් ඒ සඳහා ලෝක බලවතුන් අවංක හැඟීමෙන් යුතුව ක්‍රියාකිරීමත් අවශ්‍ය ය. එහෙත් එහි ප්‍රායෝගිකත්වය පිළිබඳ කිසිවෙකුටත් සුබවාදී ආකල්පයක් ඇති කර ගත හැකි නොවේ.

## 3 ප්‍රශ්නය

අපේක්ෂණය : කිසියම් කොටසක් කියවා එහි සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව

ව්‍යුහය : දී ඇති පාඨය තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවීම

**3.** පහත දැක්වෙන පාඨය වචන **50 - 60** අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න. *(ලකුණු 10 යි)*

ජනශ්‍රැති යනුවෙන් අප හඳුන්වනු ලබන ජන සම්ප්‍රදායයන් සියල්ල තුළින් මූලිකව ම සිදු කරනු ලැබ ඇත්තේ එක් පරම්පරාවක් විසින් ලබා ගන්නා ලද සමස්ත දැනුම් පද්ධතිය ඊළඟ පරම්පරාව සඳහා උරුම කොට දීම ය. මේ දැනුම් සම්භාරය යනු එක් අංශයක එක පැතිකඩක් පමණක් සම්බන්ධ වූ ඒවා නොවී ය. එහෙයින් කුමන ජනශ්‍රැතියක් විශ්ලේෂණයට භාජනය කරනු ලැබුවත් යම් අංශයක් හා බැඳි දැනුම් ඒ වටා ගොනු වී ඇති බව දැකිය හැකි වනු ඇත. මින්නේරිය වැව වේවා, කලා වැව වේවා, සොරබොර වැව වේවා ආශ්‍රය කොට ගත් ජනප්‍රවාද සලකා බැලූ කල්හි ඒවායෙහි විනිවිද දැකිය හැක්කේ පැරැන්නන් වැව් බැඳීම සඳහා යෝග්‍ය ස්ථාන නිශ්චිත කොට ගැනීමට පාදක කොටගත් කරුණු ය; වැව් බැඳීම සඳහා යොදාගත් තාක්ෂණික ක්‍රමවේදයන් ය; අනුගමනය කළ සිරිත් විරිත් ය; ඉටු කරන ලද පුද පිළිවෙත් ය. අනුරාධපුරය වේවා, පොළොන්නරුව වේවා, දඹදෙණිය වේවා අගනුවර ඇසුරු කොට ගත්, ජනප්‍රවාද මගින් අපට ආරක්ෂා සහිත ජයග්‍රාහී රාජකීය අගනුවරක් ඉදි කිරීම සඳහා යෝග්‍ය තැන් සොයා ගැනීමට යොදාගත් දැනුම් සම්භාරය මෙන් ම එම නගර ඉදි කිරීම සඳහා කරන ලද සැලසුම් හා උපයෝගී කොටගත් ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් ද ලද හැකි ය.

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබා දීමේ පටිපාටිය

3 සාරාංශ සඳහා අන්තර්ගත විය යුතු කරුණු


- ජනශ්‍රැති මගින් කෙරෙන්නේ සමස්ත දැනුම් පද්ධතිය පාරම්පරිකව අනාගතයට උරුම කර දීමයි.
- විවිධ අංශවල විවිධ පැතිකඩ පිළිබඳ දැනුම් ඒ තුළ අන්තර්ගත ය.
- වාරි කර්මාන්තයෙහි ලා යෝග්‍ය ස්ථාන තෝරා ගැනීම, තාක්ෂණික ක්‍රමවේද, සිරිත් විරිත් හා පුද පිළිවෙත් පිළිබඳ දැනුම
- අගනුවර නිර්මාණයෙහි ලා යෝග්‍ය ස්ථාන තෝරා ගැනීම, නගර සැලසුම් හා උපයෝගී කොටගත් ක්‍රමවේද පිළිබඳ දැනුම ද එම ජනප්‍රවාදවල අන්තර්ගත ය.

| | | |
|---|---|---|
| අන්තර්ගත කරුණු (1 1/2 × 4) | - | ලකුණු 06යි. |
| භාෂා භාවිතය | - | ලකුණු 02යි. |
| ආකෘතිය (තනි ඡේදයක් වශයෙන් ලියා තිබිය යුතුය) | - | ගකුණු 02යි. |

වචන සංඛ්‍යාව 35-45 අතර සහ 65-75 අතර වේ නම් සමස්ත ලකුණෙන් ලකුණු 01ක් අඩු කරන ලදී.

(ලකුණු 10යි)

### 2.8.3 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය **2.8(a)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 96%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

0 - 2 ප්‍රාන්තරයේ 2%ක් ද
3 - 5 ප්‍රාන්තරයේ 24%ක් ද
6 - 7 ප්‍රාන්තරයේ 51%ක් ද
8 - 10 ප්‍රාන්තරයේ 23%ක් ද

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10න් හරි අඩකට වැඩියෙන් එනම් ලකුණු 6ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හිමි කර ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 74%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 26%ක් පමණි.




ප්‍රස්තාරය **2.8(b)**

අනිවාර්ය ප්‍රශ්නයක් වූ සාරාංශකරණය සඳහා පිළිතුරු සැපයූ අපේක්ෂක සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතින අතර ඔවුන්ගෙන් 74%ක බහුතරයක් ප්‍රදානය කෙරෙන ලකුණුවලින් අඩකට වැඩියෙන් ලබා ගැනීමට සමත් වී ඇත. මේ ප්‍රශ්නයට ලකුණු හිමි වූයේ අන්තර්ගතය, භාෂා භාවිතය, ආකෘතිය යන කරුණු තුනට ය. මෙම ප්‍රශ්නයේ ලකුණු බෙදා වෙන්කර දුන් කොටස් සැලකීමේ දී අන්තර්ගතයේ පහසුතාව 58%ක් ද භාෂා භාවිතයේ පහසුතාව 58%ක් ද ආකෘතියේ පහසුතාව 77%ක් ද වශයෙන් වේ. සමස්තයක් වශයෙන් ගත් කළ සාරාංශකරණය සඳහා පහසුතාව 64%ක් වේ. අපේක්ෂකයන්ට සාරාංශකරණය පිළිබඳ මනා පුහුණුවක් තිබිය යුතු ය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ.

## 04 ප්‍රශ්නය

අපේක්ෂණය : ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරෙන් අවබෝධය පිළිබඳ හැකියාව මැනීම

ව්‍යුහය : ඡේදය ඇසුරින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයීම

**4.** පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 10 යි)*

කිසියම් ජනතාවකට බසක් ඇත්තේ හැඟීම් හා අදහස් කියා පෑමට ය. ඒ බසට සාහිත්‍යයක් ඇත්තේ ඒ අදහස් හා හැඟීම් ප්‍රබල ලෙස පවසන්නට ය. එකී සාහිත්‍යයට කවියක් ඇත්තේ ඒ හැඟීම් හා අදහස් රසවත් ලෙස නිරූපණය කිරීමට ය. කිසියම් ජනතාවක් විසින් එකී කවිය ධ්වනිපූර්ණ නිර්මාණයක් බවට පත් කළේ ස්වකීය හැඟීම් හා අදහස් රසවත් ලෙස පමණක් නොව මිහිරිසරින් ද ගයන්නට ය. ජනතාවක් සතුව ගීත කලාවක් තිබීමෙන් ගම්‍යමාන වන මූලික කාරණා දෙකක් ඇත්තේ ය. ඉන් පළමුවැන්න, එකී ජනතාව ශිෂ්ටසම්පන්න සභ්‍ය ජනතාවක් බව ය. දෙවැන්න, ඔවුන් සතු ව ඉතා ම ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් පවත්නා බව ය.

දැයක බස ගීතය දක්වා වර්ධනය වීම යනු ඒ දැය සභ්‍යත්වයට පැමිණ සිටින බව කියන ප්‍රබල ම සාක්ෂ්‍යයයි. සැබැවින් ම ගීතය දක්වා ඒ බස පැමිණි ගමන එකී ජාතියේ ශිෂ්ටාචාරය පිළිබඳ කතාන්තරය ද වන්නේ ය. ඒ අතින් සිංහලයෝ ලොවේ මුල් ම දියුණු ජාතීන් කිහිපය අතරට එක්වෙති. ඊට හේතුව ගීය ඔවුන්ගේ සාහිත්‍යයේ මුල් ම අංගයක් වූ බැවිනි. සීගිරි ගීයත්, සසදාවතත්, මුවදෙව්දාවතත් අප සාහිත්‍යයේ සිළුමිණ වූ කව්සිළුමිණත් ලොවට කියා සිටින්නේ ඒ බව ය.

(i) කිසියම් ජාතියකට බසක් අවශ්‍ය වන්නේ මූලික වශයෙන් කවර අරමුණු ඉටු කර ගැනීමට ද?

(ii) හැඟීම් හා අදහස් රසවත් ලෙස මිහිරි ස්වරයෙන් ගයන්නට නම් කවිය කෙබඳු නිර්මාණයක් බවට පත් විය යුතු ද?

(iii) කිසියම් ජාතියක් සතු ගීත කලාවක් මඟින් පිළිබිඹු වන මූලික සාධක දෙක කුමක් ද?

(iv) සිංහල භාෂාව ගීතය දක්වා වර්ධනය වී ඇති බවට මෙම ලේඛකයා දක්වන සාක්ෂ්‍ය කවරේ ද?


(v) කව්සිළුමිණ අප සාහිත්‍යයේ 'සිළුමිණ' ලෙස සලකන්නේ කවර හෙයින් ද?

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබා දීමේ පටිපාටිය

1. හැඟීම් හා අදහස් කියා පෑමට ය
2. ධ්වනි පූර්ණ නිර්මාණයක් බවට පත් විය යුතු ය
3. i. එම ජාතිය ශිෂ්ටසම්පන්න සභ්‍ය ජනතාවක් බව
   ii. ඔවුන් සතුව ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් පවත්නා බව
4. සීගිරි ගී, සසදාවත, මුවදෙව්දාවත හා කව්සිළුමිණ
5. කව්සිළුමිණ සිංහල පද්‍ය සාහිත්‍යයේ උසස් ම කාව්‍යය වන බැවින්/ සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍ය කෘති අතර චූඩා මාණික්‍යය ලෙස සැලකෙන බැවිනි,
   හෝ එවැනි සමාන අදහසක්

(ලකුණු 10යි)

### 2.8.4 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා




ප්‍රස්තාරය **2.9(a)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 95%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ. ඉන්,

0 - 2 ප්‍රාන්තරයේ 5%ක් ද
3 - 5 ප්‍රාන්තරයේ 22%ක් ද
6 - 7 ප්‍රාන්තරයේ 55%ක් ද
8 - 10 ප්‍රාන්තරයේ 18%ක් ද

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත් පිරිස 73%ක් වන අතර 27%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.



ප්‍රස්තාරය **2.9(b)**

මෙම ප්‍රශ්නයට අයත් කොටස් 5 අතුරෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ (i) කොටස සඳහා ය. එහි පහසුතාව 90%කි. (ii), (iii),(iv), (v) කොටස්වල පහසුතාව පිළිවෙළින් 74%, 80%, 17%, 12%කි. (1) කොටසේ පහසුතාව උසස් මට්ටමක පවතින අතර (iv), (v) කොටස්වල පහසුතාව ඉතා අඩු මට්ටමක පවතී. ඉදිරිපත් කර ඇති ඡේදය අවබෝධයෙන් යුතුව කියවා අසා ඇති ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයා ගැනීමට අපේක්ෂකයන් සමත් විය යුතු නමුත් බහුතර පිරිසක් තුළ එම කුසලතාව වර්ධනය වී නොමැති බව (iv), (v) අනුකොටස්වල පහසුතා මඟින් පිළිබිඹු වේ.

දෙන ලද ඡේදය ඇසුරෙන් අපේක්ෂකයාගේ අවබෝධය මැනීම තව දුරටත් සංවර්ධනය කර ගැනීම සඳහා බාහිර පොතපත, මුද්‍රිත සඟරා ආදිය පරිශීලනය සඳහා ඔවුන් යොමු කිරීම මෙන්ම පන්ති කාමරය තුළ දී අර්ථාවබෝධය පිළිබඳ අභ්‍යාසවලට හුරු කිරීම කළ යුතු ය.

දෙන ලද ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු ඍජුව තෝරා ගෙන ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් යොමු කළ යුතුව ඇත.

අවබෝධය පිළිබඳ විමසා තිබූ 4 ප්‍රශ්නයෙහි කොටස් 5හි පහසුතාව 12% - 90% අතර තිබිණි. ඒ අනුව මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 55%කි. එය හරි අඩකට වඩා වැඩි අගයක් පෙන්නුම් කළ ද මෙම තත්ත්වය තව දුරටත් වර්ධනය කිරීම සඳහා බාහිර පොත්පත් පරිශීලනය කිරීමට ශිෂ්‍යයන් උනන්දු කිරීම ගුරු භවතුන්ගේ කාර්යයයි. එහි ලා දුරාවබෝධ වචනවල අර්ථාවබෝධය කෙරෙහි ද ශිෂ්‍යයන් යොමු කළ යුතු ය.

## 05 ප්‍රශ්නය

අපේක්ෂණය : ප්‍රායෝගික ලේඛන පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම

ව්‍යුහය : නිර්දිෂ්ට ප්‍රායෝගික/ ලේඛන දෙකක් ඇසුරෙන් ප්‍රශ්නය සැකසී ඇත

**5.** පහත සඳහන් තොරතුරු පදනම් කරගෙන ආරාධනා පත්‍රයක් පිළියෙල කරන්න.

සිද්ධිය : රත්නපුර දිස්ත්‍රික් අන්තර් පාරිවේණික විවාද තරගාවලියේ අවසන් පූර්ව වටයෙන් තේරුණු සඳගිරිගම ශ්‍රී විද්‍යාමංගල මහා පිරිවෙන හා රත්මල්ගම ශ්‍රී විද්‍යාසාගර මහ පිරිවෙන අතර අවසන් මහා තරගය

උත්සවය පැවැත්වෙන දිනය : 2022 ජුනි මස 5 වෙනි දා

වේලාව : ප.ව. 2.00

ස්ථානය : රත්නපුර නගර ශාලාව

ප්‍රධානත්වය : සබරගමුව පළාත් පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ

ආරාධනා ලබන්නෝ : ප්‍රදේශයේ පිරිවෙන්වල හා පාසල්වල ආචාර්යවරු හා අ.පො.ස. (උසස් පෙළ) ශිෂ්‍ය ශිෂ්‍යාවෝ

ආරාධනා කරන්නා : අන්තර් පාරිවේණික විවාද තරග සංවිධායක කමිටුවේ ලේකම්

ලිපිනය : රත්නපුර, මුද්දුව, ශ්‍රී සුමංගල මහ පිරිවෙන

ආරාධනා කරන දිනය : 2022.05.22

(වචන **100** ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.) *(ලකුණු 15 යි)*

**නැතහොත්**

පහත සඳහන් තොරතුරු පදනම් කරගෙන රාජකාරී ලිපියක් ලියන්න.

යොමුව : අරණායක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

ඉල්ලීම් කරන්නා : අරණායක සිරිපුර පුබුදු කුඩා තේ වතු සංවර්ධන සමිතියේ ලේකම්

ඉල්ලීම : එක්දින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම සඳහා බුත්ගමුව මහා විද්‍යාලයීය ක්‍රීඩාංගනයේ ඉඩ පහසුකම් ලබා ගැනීම

වැඩමුළුව : ජීව වායු ජනන ඒකක නිර්මාණය හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳ දිනක පුහුණුව

අනුග්‍රහය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය

සංවිධානය : අරණායක, සිරිපුර, පුබුදු කුඩා තේ වතු සංවර්ධන සමිතිය

දිනය : 2022 මැයි 28

වේලාව : පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා

(වචන **100** ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.)

*(ලකුණු 15 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබා දීමේ පටිපාටිය.

5. <u>ආරාධනා පත්‍රය</u>

- ආකෘතිය (ලකුණු 04යි.)
  - ආරාධනය (මාතෘකාව) - ලකුණු 01යි
  - ආරාධනය කරන්නා (තනතුරු නාමය) හා සංවිධානය - ලකුණු 01යි
  - ලිපිනය - ලකුණු 01යි
  - ආරාධනා කරන දිනය - ලකුණු 01යි

- අන්තර්ගතය (ලකුණු 08යි)
  - සිද්ධිය - ලකුණු 01යි
  - පැවැත්වෙන දිනය - ලකුණු 01යි
  - පැවැත්වෙන වේලාව - ලකුණු 01යි
  - පැවැත්වෙන ස්ථානය - ලකුණු 01යි
  - ප්‍රධානත්වය - ලකුණු 01යි
  - ආරාධනා ලබන්නෝ - ලකුණු 01යි
  - සංක්ෂිප්ත බව - ලකුණු 01යි
  - සිත්ගන්නා සුළු නිමාව - ලකුණු 01යි
- ශිල්පීය දක්ෂතා (ලකුණු 03යි)
  - අක්ෂර වින්‍යාසය හා අත්අකුරු - ලකුණු 01යි
  - උක්තාඛ්‍යාත පද සම්බන්ධය - ලකුණු 01යි
  - පද බෙදා ලිවීම හා විරාම ලක්ෂණ - ලකුණු 01යි


<u>රාජකාරි ලිපිය</u>

ආකෘතිය (ලකුණු 05යි)
- යවන්නාගේ නම ලිපිනය හා දිනය - ලකුණු 01යි
- ලබන්නාගේ තනතුරු නාමය හා ලිපිනය - ලකුණු 01යි
- ආමන්ත්‍රණය - ලකුණු 01යි
- මාතෘකාව - ලකුණු 01යි
- අවසානය, අත්සන, නම හා තනතුර - ලකුණු 01යි

අන්තර්ගතය (ලකුණු 07යි)
- සංවිධානය කරන සමිතිය - ලකුණු 01යි
- අනුග්‍රහය - ලකුණු 01යි
- වැඩමුළුව - ලකුණු 01යි
- ඉල්ලීම - ලකුණු 01යි
- දිනය සහ වේලාව - ලකුණු 01යි
- සංක්ෂිප්ත බව - ලකුණු 01යි
- සිත් ගන්නා සුළු නිමාව - ලකුණු 01ය

ශිල්පීය දක්ෂතා (ලකුණු 03යි)
- අක්ෂර වින්‍යාසය - ලකුණු 01යි
- උක්තාඛ්‍යාත පද සම්බන්ධය - ලකුණු 01යි
- පද බෙදා ලිවීම හා විරාම ලක්ෂණ - ලකුණු 01යි

### 2.8.5 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 83%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ. ඉන්

0 - 3 ප්‍රාන්තරයේ 5%ක් ද
4 - 7 ප්‍රාන්තරයේ 21%ක් ද
8 - 11 ප්‍රාන්තරයේ 49%ක් ද
12 - 15 ප්‍රාන්තරයේ 25%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්නයකි. දී ඇති ප්‍රශ්න දෙක අතුරෙන් එක් ප්‍රශ්නයක් තෝරා ගෙන පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට අවස්ථාව ලබා දී ඇත.

**ප්‍රස්තාරය 2.10(a)**




ප්‍රස්තාරය **2.10(b)**

5 ප්‍රශ්නයේ වෛකල්පික ප්‍රශ්න දෙක සඳහා දක්වා ඇති සමස්ත පහසුතාව පිළිවෙළින් 58% හා 64%කි. ඒ අනුව පහසුතාව මධ්‍යස්ථ මට්ටම ඉක්මවා සිටී. ප්‍රායෝගික ලේඛන යටතේ පළමු ප්‍රශ්නය වන ආරාධනා පත්‍රයෙහි ආකෘතියට ලකුණු 04ක් ද අන්තර්ගතයට ලකුණු 08ක් ද ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03ක් ද වෙන් කර ඇත. විකල්ප දෙවන ප්‍රශ්නය වන රාජකාරි ලිපියේ ආකෘතියට ලකුණු 05ක් ද අන්තර්ගතයට ලකුණු 7ක් ද ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03ක් ද වෙන් කර ඇත.

සමස්තයක් වශයෙන් විකල්ප ප්‍රශ්න දෙකට ම සපයා ඇති පිළිතුරු සතුටුදායක මට්ටමක පවතී. ප්‍රායෝගික ලේඛන සඳහා අපේක්ෂකයන් වැඩි මනාපයක් දක්වන්නේ එය පහසුවෙන් ලකුණු ලබා ගත හැකි ප්‍රශ්නයක් නිසා ය. එබැවින් විවිධ ප්‍රායෝගික ලේඛන ආකෘතීන්ට හුරු කරවීම සඳහා ඔවුන් දැනුවත් කොට විවිධ අභ්‍යාසවල යෙදවීම යෝග්‍ය වේ.

මෙම ප්‍රශ්නයේ කොටස් දෙක සඳහාම ලකුණු ලබා දුන් ආකෘතිය, අන්තර්ගතය, ශිල්පීය දක්ෂතා යන කරුණු සඳහා ලකුණු ලබා ගැනීමට මධ්‍යස්ථ මට්ටමක පවතී. මෙහි දී අන්තර්ගතයට අයත් ප්‍රධාන කරුණු හඳුනා ගැනීමට අපේක්ෂකයන් හුරු කළ යුතු ය. එසේ වූ විට අන්තර්ගතයට වෙන්කර ඇති මුළු ලකුණු අපේක්ෂකයන්ට හිමි කර ගැනීමට පහසු වේ.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**II පත්‍රය - කාලය : පැය 02යි.**

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් සමන්විත ය.
1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ. 5, 6, 7 ප්‍රශ්නවලින් එකක් තෝරා ගත යුතු ය.

**1 ප්‍රශ්නය** : කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්තය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

**2 ප්‍රශ්නය** : නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගත් ගද්‍ය පද්‍ය කොටස් ඇසුරෙන් මේ ප්‍රශ්නය සකස් කෙරෙන අතර අනුකොටස් දෙකකින් යුත් කොටස් 5කි න් සමන්විත වේ. එක් අනුකොටසකට ලකුණු 02බැගින් ලකුණු 20කි.

**3 ප්‍රශ්නය** : වෛකල්පික ප්‍රශ්න දෙකකින් එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය ලකුණු 15කි.


**4 ප්‍රශ්නය** : වෛකල්පික ප්‍රශ්න දෙකකින් එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය ලකුණු 15කි.

**5,6,7 ප්‍රශ්නය** : වෛකල්පික ප්‍රශ්න තුනකින් එකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය ලකුණු 10කි.

**II පත්‍රය සදහා මුළු ලකුණු = 20 + 20 + 15 + 15 + 10 = 80**

| | | |
|---|---|---|
| **අවසාන ලකුණු ගණනය කිරීම -** | **I පත්‍රය** | = 120 |
| | **II පත්‍රය** | = 80 |
| | **අවසාන ලකුණු 200/2** | = 100 |

## 3. 2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





**ප්‍රස්තාරය 3.1**

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි මුල් ප්‍රශ්න 4ට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. අපේක්ෂකයන් 100% ක් පිළිතුරු සපයා ඇත්තේ 1 ප්‍රශ්නයට පමණි. 2 ප්‍රශ්නය සඳහා 89%ක් ද 3 ප්‍රශ්නය සඳහා 72% ක් ද 4 ප්‍රශ්නය සඳහා 59%ක් ද පිළිතුරු සපයා ඇත. 5, 6,7 ප්‍රශ්න අතුරෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. 5වන ප්‍රශ්නය 20%ක් ද 6,7 ප්‍රශ්න පිළිවෙළින් 5%ක් හා 8%ක් වශයෙන් ද අපේක්ෂකයන් පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇත.

## 3. 3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය (ලකුණු ප්‍රාන්තර අනුව)





**ප්‍රස්තාරය 3.2**

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න් මෙම ප්‍රස්තාරයට අනුව 76- 100 ප්‍රාන්තරයේ එනම් ලකුණු 16-20 අතර ලබා ගත් ප්‍රතිශතය 2%කි. වෙන් කර ඇති ලකුණු 20න් 0%-25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 - 5 අතර ලබා ගත් ප්‍රතිශතය 71%කි.

## 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 3.3

## 3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය

1 ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යුහය : කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න 10ක් ඇතුළත් වේ.

**1. අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.** *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) පහත සඳහන් කෘති රචනා වී ඇති සාහිත්‍ය යුග කවරේදැයි නම් කරන්න.

(අ) සද්ධර්මරත්නාකරය

(ආ) දහම්සරණ

(ii) (අ) 'සද්ධර්මාලංකාරය' යන්නෙහි වචනාර්ථය කුමක් ද?

(ආ) සද්ධර්මාලංකාරය කෘතියේ සඳහන් ලක්දිව කතා අයත් වන්නේ කුමන රජවරුන් අතර කාල සීමාවට ද?

(iii) (අ) සාරාර්ථදීපනී අටුවාවට අනුව ජාතක කථා ලිවීමේ එක ම අරමුණ ලෙස දැක්වෙන්නේ කුමක් ද?

(ආ) ජාතක පොත ඒක කර්තෘක කෘතියක් ලෙස නොපිළිගැනීමට හේතුව කුමක් ද?

(iv) 'කිසිවක්හට මෙපවත් කීම් නම් මාගේ බණ ඇසීමට අන්තරාය වෙයි'

(අ) මෙම ප්‍රකාශය උපුටාගත් මුල් කෘතිය කුමක් ද?

(ආ) මෙහි සඳහන් අය කීමට මැළි වූ කරුණ කුමක් ද?

(v) (අ) 'ගුරු ගෙදර යන අතර මග' කවි පෙළේ රචකයා කවරෙක් ද?

(ආ) මහගමසේකර කවියා අයත් වන්නේ කොළඹ යුගයේ කුමන කාණ්ඩයට ද?

(vi) 'අයියා ඔය විදියට කතා කරන්ඩ එපා. ඌ කිව්වේ මහ ලජ්ජා නැති කතා. මට ඒවා කියන්ඩවත් බෑ.'

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙහි 'අයියා' යනුවෙන් සඳහන් වන අයගේ නම ලියන්න.

(vii) මට කළ මෙ විපත අනේ
බලා ගන්නෑ දෙවිය නේ
වැජැඹෙන නා මෙ විමනේ
බලන්නෑ නා! සාමි නේ

(අ) මෙම කවිය ඇතුළත් පැදි පෙළේ නම ලියන්න.

(ආ) මෙහි සඳහන් තැනැත්තාට සිදුව ඇති විපත කුමක් ද?

(viii) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

උදේ සැපත් සුර ගුරු අලු කැරැ අවට
සඳේ මුදුන් පත අස්විද නැකැත සිට

(අ) ..............................................................

(ආ) ..............................................................

(ix) "සකක් හා සමාන සොඳ මුහුණක් ඇති තමාගේ ජාතියට ඉතා රූපත් වූ කොටළු දෙනෙක ගෙනවුත් පාවා දෙමි."

(අ) මෙම කොටස උපුටා ගත් මුල් කෘතියේ රචකයා කවරෙක් ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත කොටසින් හැඟවෙන කාව්‍යාලංකාරය කුමක් ද?

(x) (අ) 'නිකාය සංග්‍රහය' ග්‍රන්ථයේ කතුවරයා කවරෙක් ද?

(ආ) අනුරාධපුර අවධියේ රචිත කාව්‍යානුශාසන ග්‍රන්ථය නම් කරන්න.

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1. (i) (අ) කෝට්ටේ අවධිය/ යුගය/ කෝට්ටේ
(ආ) පොළොන්නරු අවධිය/ යුගය,/පොලොන්නරු

2. (ii) (අ) යහපත් ධර්මය නම් සැරසිල්ල
(ආ) දෙවන පෑතිස් සහ වට්ටගාමිණී අභය දෙරජුන් අතර කාල සීමාවට

3. (iii) (අ) බුදුරජාණන් වහන්සේගේ පූර්ව ජන්ම පිළිබඳ පුරාණ කථා ඉදිරිපත් කිරීම
(ආ) රචනා ශෛලියේ පවතින විවිධතාව

4. (iv) (අ) සද්ධර්මාලංකාරය
(ආ) සර්පයෙකු තම පුතුට දෂ්ට කොට ඇති බව

5. (v) (අ) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ
(ආ) නිදහස් කවියේ ප්‍රථම යුගය/ අවධිය

6. (vi) (අ) පුංචි මැණිකා
(ආ) ප්‍රනාන්දු

7. (vii) (අ) හැවිල්ල
(ආ) තමාගේ කුකුළා නසා දැමීම


8. (viii) (අ) නඳේ සිතින් තම කුල දෙවිය සිහි කොට
(ආ) යෙදේ ගමන් යහළුව මෙපුරෙන් තොපට

9. (ix) (අ) ධර්මසේන හිමි
(ආ) උපමාලංකාරය

10. (x) (අ) ධර්ම කිර්ති සංඝරාජ හිමි/ ද්විතිය ධර්ම කිර්ති හිමි/දේවරක්ෂිත ජයබාහු ධර්මකීර්ති සංඝරාජ හිමි
(ආ) සියබස්ලකර.

(ලකුණු 2 : 10 = 20යි)

### 3. 5. 1 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා.





ප්‍රස්තාරය 3.4(a)

1 ප්‍රශ්නය තෝරා ගෙන ඇති පිරිස 100%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන්

0 - 5 ප්‍රාන්තරයේ 71%ක් ද
6 - 10 ප්‍රාන්තරයේ 25%ක් ද
11 - 15 ප්‍රාන්තරයේ 2%ක් ද
16 - 20 ප්‍රාන්තරයේ 2%ක් ද

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් පිරිස 96%කි. ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 4%කි.




ප්‍රස්තාරය 3.4(b)

මෙම ප්‍රශ්නය කොටස් 10කින් ද අනුකොටස් 20කින් ද සමන්විතය. ඒ අතුරෙන් පහසුතාව වැඩිම VI(අ) අනුකොටසෙහි පහසුතාව 52%කි. පහසුතාව අඩුම (II) (ආ) අනුකොටසෙහි පහසුතාව 6%කි.

මෙම ප්‍රශ්නවලට අමතරව පහසුතාව අඩු වන්නේ (iii)(ආ), (iv)(ආ), (vii)(ආ), (viii)(අ), (ආ), (x) (ආ) යන අනුකොටස්වලටය, ඒ අනුව එම අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් 12%, 13%, 8%, 9%, 8% හා 10%කි. පොදුවේ ගත්කළ සෙසු අනුකොටස් සඳහා පහසුතාව 16% - 29% දක්වා පරාසයක විහිදී පැවතිණි. මෙම ප්‍රශ්න විශ්ලේෂණය කළවිට පහත සඳහන් කරුණු ඉදිරිපත් කළ හැකිය. ඒ අනුව 1 ප්‍රශ්නයේ I කොටස (අ) (ආ) අනුකොටස් සද්ධර්මාරත්නාකරය හා දහම්සරණ පොත් පාදක කර ගෙන ද II කොටස සද්ධර්මාලංකාරය කෘතිය පාදක කර ගෙන ද III කොටස පන්සිය පනස් ජාතක කථා පොත පාදක කරගෙන ද IV කොටස සද්ධර්මාලංකාරය පාදක කර ගෙන ද V හා VII කොටස් නූතන පද්‍ය ඇසුරෙන් ද VI කොටස බැද්දේගම නවකතාව පාදක කර ගෙන ද VIII කොටස සැළලිහිණි සන්දේශය පාදක කර ගෙන ද IX කොටස සද්ධර්මරත්නාවලිය පාදක කර ගෙන ද X කොටස නිකාය සංග්‍රහය, සියබස්ලකර ඇසුරෙන් ද සැකසී තිබුණි.

මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී පහසුතා අඩුවීමෙන් පැහැදිලි වන්නේ නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පද්‍ය කෘති පරිශීලනය සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන දුර්වලතාවයි. මෙම තත්ත්වය මඟහරවා ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම් ඉහළ අගයකට ගෙන ඒමට නම් නිර්දිෂ්ට ග්‍රන්ථ අනුසාරයෙන් අනුමාන ප්‍රශ්න සකසා පිළිතුරු ලිවීම, වාචික කෙටි ප්‍රශ්න තරග පැවැත්වීම, අදාළ පද්‍ය කෘතිවලින් සුදුසු කවි තෝරා දී ඒවා වන පොත් කරවීමට සැලැස්වීම වැනි කරුණු කෙරෙහි ගුරුවරයා සැලකිලිමත් වුවහොත් ඉහළ සාධන මට්ටමක් වෙත ශිෂ්‍යයා යොමු කරවීමට හැකි වනු ඇත.

## 2 ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය ඇති ව පාඨය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.

ව්‍යුහය : නිර්දිෂ්ට ගද්‍ය/ පද්‍ය පාඨ ඇසුරෙන් ප්‍රශ්න සැකසී ඇත.

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා, ඒ එකිනෙකට අදාළ ව (i) සිට (v) තෙක් දී ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 04 × 5 = 20 යි)*

(i) මත්තහස්තිරාජයක්හු අල්වන්ට නික්මුණු කේශර සිංහරාජයෙකගේ විලාසයෙන් අප්‍රමාණ සර්වඥ ලීලාවෙන් දම්සභා මණ්ඩපයට වැඩ සරහන ලද මණ්ඩප මධ්‍යයෙහි පනවන ලද උතුම් වූ බුද්ධාසන මස්තකයට පැනනැගි **ෂඩ්වර්ණ** බුද්ධරශ්මි මාලාවන් විහිදුවමින් **සාගරකුක්ෂිය** බබුළුවමින් යුගඳුරු මුඳුනෙහි දිලිසෙන්නා වූ ළහිරු මඬලක් මෙන් දිලිහි දිලිහී ආසන මධ්‍යයෙහි වැඩ උන් සේක.

(අ) මෙම පාඨයේ සඳහන් උපමා දෙක උපුටා දක්වන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(ii) බබෙහාමි මුල දී ඔහුට කන් නොදුන් නමුත් සිළිඳුගේ කලබලයත් කෝපයත් ඔහුගේ කන් ඇද ගැනීමෙහි සමත් විය. සිළිඳු මේ අන්තිමට කී වචන ටික ඉවර වන විට බබෙහාමි බාගයට නතර වී ආපසු බැලීය. සිළිඳුගේ කෝප දීප්ත දෙනෙතත් තද වූ තොල් කෙළවර තුබුණු කෙළත් ඔහුට යන්තම් පෙනුණා පමණි.

(අ) සිළිඳු දැඩි ලෙස කෝපයට පත් වී සිටීමට හේතු මොනවා ද?

(ආ) තම කෝපය සංසිඳවා ගැනීමට සිළිඳු ගත් ක්‍රියාමාර්ගය කුමක්දැයි කෙටියෙන් ලියන්න.

(iii) එමහගම් නුවර සමීපයෙහි කරන ලද රජමහා විහාර මධ්‍යයෙහි අති ධවල වූ මහා ප්‍රාකාරයෙන් **පරික්ෂෙප** කරන ලද මුතුරැසක් හා සමාන සුදුවැලි තලාවෙන් ශොභමාන වූ මහවැලි මළුව මැද පෘථිවි තල නමැති අඞගනාවගේ මුදුනෙහි බහා පළඳනා ලද රජත කිරීටයක් මෙන් අති ධවල ශොභාවෙන් අග්‍රප්‍රාප්ත ව මාණික්‍යමය ථූපිකාවකින් මුදුන් පැමිණියා වූ මහත් දාගබෙක් විය.

(අ) මෙම පාඨයේ දැක්වෙන උපමාවක් සහ රූපකයක් උපුටා දක්වන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(iv) හා නා කුඹුරු තැන තැන ගොවියන් තුටිනී
පේ නා අඹ දිවුල් තුරු තුරු පල බරිනී
නා නා **සියොත්** රඟ දක්වන තුටු රැවිනී
පී නා යෙයි **සතන්** මෙ වසත් කල් බැවිනී

(අ) වසන්ත කාලයේ අසිරිය ගැන කවියා මවන වාක් චිත්‍රය කෙටියෙන් විස්තර කරන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(v) මිතුරු තුමෝ දුක සැප දෙකෙහි ම පැවති
බිතු සිතුවම් රූ මෙන් පිටු නොපා විති
යුතු මතු වැඩ ම තෙපළ එවැනි ගුණ ඇති
සිතු නතු කර අස යහළුව වඩන රැති

(අ) මෙම පද්‍යයේ ඇතුළත් උපමාව සහ උපමේය වෙන්කොට දක්වන්න.

(ආ) මුළු පද්‍යයේ ම අදහස සරල බසින් ලියන්න.

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) (අ) ● කේෂර සිංහරාජයකුගේ විලාසයෙන්
● යුගඳුරු මුදුනෙහි දිළිසෙන්නා වූ ළහිරු මඬලක් මෙන්

(ආ) ● ෂඩ් වර්ණ - වර්ණ හය/ පාට හය
● සාගර කුක්ෂිය - සාගර ඇතුළත/ සාගර ගර්භය/ සයුරු ගැබ/ මුහුදු ගැබ

(ii) (අ) ● බොරු නඩුවක් පටලවා බබුන් හිරේ යැවීම
● තම දියණිය ප්‍රනාන්දුට ලබා දීමට ආරච්චිල උත්සාහ කිරීම
● ප්‍රනාන්දු තම දියණිය ලබා ගැනීමට උත්සාහ කිරීම
හේතු දෙකක් ලිවීම ප්‍රමාණවත් ය.

(ආ) බබේහාමි ආරච්චිල සහ ප්‍රනාන්දු මුදලාලි මරා දැමීම/ ආරච්චිල හා මුදලාලි මරා දැමීම

(iii) (අ) ● උපමාව - මුතු රැසක් හා සමාන/ රජත කිරීටයක් මෙන්
● රූපකය - පෘථිවි තල නමැති අඬගනාව

(ආ) පරික්ෂේප - වට කිරීම/ වට
ථූපිකාවකින් - කොතකින්/ කොත් කැරැල්ලකින්


(iv) (අ) හානා කුඹුරු, ගොවියන් සතුටෙන් සිටින අයුරු, පල බරින් යුතු තුරු, නොයෙක් ආකාරයේ කුරුල්ලන් සතුටු වන අයුරු, වසන්ත කාලය නිසා සත්වයන් තුටු වන බව වැනි විස්තරයක් ලියා තිබීම ප්‍රමාණවත් ය.

(ආ) සියොත් - කුරුල්ලන්
සතන් - සත්වයන්/ සතුන්

(v) (අ) උපමාව - බිතු සිතුවම් රූ මෙන්
උපමේය - දුක සැප දෙකෙහි ම එකසේ සිටින මිතුරන්

(ආ) දුක සැප දෙකෙහි ම වෙනස් නොවී සිටින මිතුරෝ බිතුසිතුවම් මෙන් පිටු නොපාති. මතු වැඩම සලසා ගැනීම සඳහා එවැනි ගුණ ඇති මිතුරන්ට සවන් දෙන්නට අශාව/ අභිලාෂය ඇති කර ගැනීමට සිත අවනත කර ගන්න.

### 3.5. 2  2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.5(a)

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ප්‍රතිචාර දක්වා ඇති ආකාරය සැලකීමේ දී මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 89%ක් වුව ද නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය අවම වී ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වේ. ඉන්,

0 - 5 ප්‍රාන්තරයේ 49%ක් ද
6 - 10 ප්‍රාන්තරයේ 40%ක් ද
11 - 15 ප්‍රාන්තරයේ 10%ක් ද
16 - 20 ප්‍රාන්තරයේ 1%ක් ද

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් පිරිස 89%කි. ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 11%කි.




ප්‍රස්තාරය 3.5(b)

මෙම ප්‍රශ්නය කොටස් 5කින් ද අනුකොටස් 10කින් ද සමන්විත වේ. ඒ අතුරෙන් පහසුතාව වැඩිම (iv) කොටසෙහි (අ) අනුකොටසෙහි පහසුතාව 49%කි. (i) කොටසෙහි (අ) අනුකොටසෙහි පහසුතාව 45%කි. (iii) (අ) අනුකොටසෙහි පහසුතාව 28%ක් ද (v) කොටසෙහි (ආ) අනුකොටසෙහි පහසුතාව 37%ක් ද විය. අනෙක් කොටස්වල අනුකොටස් සඳහා පහසුතාව 14% සිට 26% දක්වා පරාසයක විහි දී පවතින බව පෙනෙයි.

පුරාතන ගද්‍ය පද්‍ය හා නූතන සාහිත්‍යයට අයත් පාඩම්වල කතාසාරය අවස්ථා හා සිද්ධි මතකයේ රැඳෙන ආකාරයට ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමට ගුරුභවතුන් යොමු විය යුතු අතර එමගින් අපේක්ෂකයන්ගේ සාධන මට්ටම වර්ධනය කර ගැනීමට මඟ පෙන්වීම වැදගත් වේ. නිර්දිෂ්ට සාහිත්‍ය කොටස් ඇසුරෙන් නිරන්තර අභ්‍යාසවල යෙදවීම මගින් සාර්ථක පිළිතුරු ලිවීමට අපේක්ෂකයන් දිරි ගැන්විය හැකිය.

## 3 ප්‍රශ්නය

අපේක්ෂණය : ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රස වින්දන හැකියාව ඇගයීම

ව්‍යූහය : විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය.

**3.** (අ) සොබාදම් අසිරිය වර්ණනාවට ලක් කිරීමත්

(ආ) අජීව වස්තුවකට සජීව ස්වභාවයක් ආරෝපණය කිරීමත්

නිසා 'මියුණු ඇල්ල' පැදි පෙළ සුන්දර කාව්‍ය නිර්මාණයක් බවට පත් ව ඇත.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(අ) චරිත නිරූපණයත්

(ආ) උචිත අවස්ථා යොදා ගැනීමත්

'බැද්දේගම' නවකතාවේ සාර්ථකත්වයට හේතු වී ඇත.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

3. • සොබාදම් අසිරිය වර්ණනාවට ලක් කිරීම

උදාහරණ :-

- අල්ලා අතින් පාවෙන වන මල් කළඹ
- ගල්පර නැමැති උස් රඟ මඬලට එළඹ
- කුකුළු කෝරළයෙ දිය දහරා තරුව
- ඔල්වර හඬ නගන මගෙ ඇලි ළඳ මියුණු
- වන විහඟුන්ගේ ගී තිගෙ ගැයුමට ම ඇතී
- මුසු වී මිහිරි සංගීතය නගනු දැනී
- අමුණා ගති පබළු ඇට පෙණ පිඩු විසි වී
- දිය බිඳු විසිර මිහිදුම් සළුවකට නැගේ

• අජීව වස්තුවකට සජීව ස්වභාවයක් අරෝපණය කිරීම

උදාහරණ :-

- සොලවාපන් තවත් දිය සුළි මිණි සළඹ
- තී මට හෙළන්නෙහි අද බැල්මක් තියුණු
- නටතත් මොහොතකුදු නොහැරම උකුළ වනා
- තිගෙ රැගුමෙ දි ගතින් මීදි දිය වැල් ඔසරී
- දහඩිය නමැති පෙණ පිඩු එහි ලන්නීය
- තී මා සතපවන්නෙහි සිහිනෙක මිහිරී
- කවදා - කුමක් උදෙසා හිනැහුණි ද අනේ
- ලස්සන වසන් කරනට මෙන් තිගෙම ඉනේ

වැනි උදාහරණ හෝ වෙනත් සුදුසු උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.

නැතහොත්

- **චරිත නිරූපණය**

  උදාහරණ :-


  පුංචි මැණිකා, සිලිඳු, බබුන්, ආරච්චිල, ප්‍රනාන්දු, පුංචිරාළ, කරලිනාහාමි වැනි චරිත දෙකක් නවකතාවේ නිරූපණය කර ඇති ආකාරය උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.
- උචිත අවස්ථා යොදා ගැනීම

  උදාහරණ:-
- සිලිඳු තම දරුවන් සම්බන්ධයෙන් කටයුතු කරන අයුරු
- ආරච්චිල සිලිඳු සම්බන්ධයෙන් ගන්නා තීරණ
- ආරච්චිල බබුන්ගේ ක්‍රියා කලාප ගැන කටයුතු කරන ආකාරය
- පුංචි මැණිකා බබුන් සමග විවාහ වීම
- බබුන් සිරගත වීම සම්බන්ධ සිදුවීම්
- බබුන් සිරගත වීමෙන් අනතුරු ව පුංචි මැණිකා ක්‍රියා කරන ආකාරය
- පුංචිරාළගේ ක්‍රියා කලාපය
- ප්‍රනාන්දු මුදලාලි, බබුන් හා පුංචි මැණිකා සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය
- සිලිඳු විසින් ආරච්චි සහ ප්‍රනාන්දු යන දෙදෙනා මරා දමනු ලැබීම

වැනි උදාහරණ හෝ වෙනත් සුදුසු උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍යය.

| | |
|---|---|
| එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වා තිබීම. | ලකුණු 04යි |
| විස්තර කර තිබීම | ලකුණු 11යි |
| | මුළු ලකුණු 15යි |

### 3.5.3 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





**ප්‍රස්තාරය 3.6(a)**

තුන්වෙනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වූවකි. මෙම ප්‍රශ්නය සඳහා මුළු අපේක්ෂකයන්ගෙන් පිළිතුරු සපයා ඇත්තේ 72%ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය 15කි. ඉන්

0 - 3 ප්‍රාන්තරයේ 51%ක් ද
4 - 7 ප්‍රාන්තරයේ 28%ක් ද
8 - 11 ප්‍රාන්තරයේ 15%ක් ද
12 - 15 ප්‍රාන්තරයේ 6%ක් ද

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 07ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් පිරිස 79%කි. ලකුණු 08ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 21%කි.




**ප්‍රස්තාරය 3.6(b)**

3 ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එම ප්‍රශ්න දෙක අතුරෙන් පළමුවන ප්‍රශ්නයෙහි පහසුතාව 22%කි. දෙවන ප්‍රශ්නයෙහි පහසුතාව 35%කි. මෙම පළමු විකල්ප ප්‍රශ්නයෙහි පහසුතාවට වඩා දෙවන විකල්ප ප්‍රශ්නයෙහි පහසුතාව වැඩි වී ඇති බව පෙනේ. 'මියුණු ඇල්ල' කවි පෙළ ඇසුරෙන් තිබූ පළමු ප්‍රශ්නයට වඩා 'බැද්දේගම' නවකතාව ඇසුරෙන් සැකසුණු දෙවන ප්‍රශ්නයේ පහසුතාව වැඩි වී ඇත.

නූතන පද්‍ය සාහිත්‍ය ඇසුරෙන් සැකසෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා අපේක්ෂකයන් තුළ මනා පරිචයක් ඇති කිරීම පිණිස සුදුසු ඉගැන්වීම් ක්‍රම අනුගමනය කිරීමට ගුරුභවතුන් යොමු වීම යෝග්‍ය ය. රසවින්දනයේ දී කවිවලින් ගම්‍ය වන ධ්වනිතාර්ථ කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරවීම එහි ලා ඉතා වැදගත් වේ.

බැද්දේගම නවකතාව ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයේ චරිත නිරූපණය හා උචිත අවස්ථා යොදා ගැනීම සම්බන්ධ පිළිතුරු පළමු ප්‍රශ්නයට වඩා සාර්ථකව ඉදිරිපත් කර තිබුණත් සමස්තයක් වශයෙන් කිසිදු අපේක්ෂකයකු මධ්‍යස්ථ ලකුණු මට්ටමකටවත් ළඟා නොවීම කැපී පෙනේ. 79%කට ආසන්න අපේක්ෂකයන් ප්‍රමාණයක් ලකුණු 07ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන තිබීම මගින් එය සනාථ වේ.

සමස්තයක් වශයෙන් ගත් කළ මෙකී ප්‍රශ්න පිළිබඳ පන්ති කාමරයේ දී සාකච්ඡා කිරීම හා ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම මගින් නිර්දිෂ්ට කෘති කෙරෙහි අපේක්ෂකයන්ගේ ප්‍රතිචාරය වර්ධනය කිරීමෙන් පිළිතුරු සැපයීමේ හැකියාව සතුටුදායක මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වේ.

**4 ප්‍රශ්නය**

අපේක්ෂණය : ඇගයිම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රස වින්දන හැකියාව ඇගයීම.

ව්‍යුහය : විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය.

(අ) වර්ණනා චාතුර්යයත්

(ආ) සුලලිත පද සංඝටනයත්

සැළලිහිණි සන්දේශ කතුවරයාගේ ප්‍රතිභාපූර්ණත්වය විදහා දක්වයි.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

(අ) සිද්ධි පෙළ ගැස්වීමත්

(ආ) කතා රසය ජනිත වන ලෙස ඉදිරිපත් කිරීමත්

නිසා 'නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව' කතාව පාඨක සිත් ආකර්ෂණය කිරීමට සමත් ව ඇත.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

*(ලකුණු 15 යි)*

- සැදී රත තඹර පෙළ රන තිසරුන් රුවැති
- සමනොළ මුහුළ මහ සමුදුර මෙවුල් බර
- විපුල් රන් සෙමෙර බඳ රන් දද සසල
- උදාගිරි කසුන් රිටි වැට හිස බැබළි
- සුරරද සමන් සමගින් සුරඟන එවර
- නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුළ
- වඩිමින් සවස නල හැසිරෙන දිගතුවල

- සුලලිත පද සංඝටනය
  - පොහොසද්දන ඇති තුනුරුවන බැති පෙමා
  - ජයවද්දන පුරවර දනු මිතුරු තුමා
  - දුවන බඳ කිකිණි හය කුර පහර නද
  - නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩි
  - නලබල සසල දළ රළ පෙළ නුඹ නැගෙන
  - අග පිපි මල් මලිගිය කැලේයා
  - රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී
  - සලා දුලා<br>පුලා නිලා<br>කලා පිලා<br>බලා පලා
  - පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට<br>බඳ කිකිණිය දද ගිගිණිය විමන් වට<br>නොව පැරණිය වන රමණිය විටින් විට<br>සැලලිහිණිය වඩු කැළණිය පුර වරට

වැනි උදාහරණ හෝ වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.

නැතහොත්

සිද්ධි පෙළගැස්වීම.


- බුදුන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කරවීම
- නන්ද කුමරුන් අතට පාත්‍රය දීම හා බුදුන් වහන්සේ පාත්‍රය දැන් ගනිති යි සිතමින් පසුපසින් යාමට සැලැස්වීම
- දනවු කළණ කුමරියගේ බස් නන්ද කුමරුන්ට අසන්නට සැලැස්වීම
- නන්ද කුමරුන් බුදු සසුනේ මහණ වීම
- මහණ දම් පිරීමේදී සිදුවන සිදුවීම්
- බුදුරජාණන් වහන්සේ නන්ද කුමරුන් තව්තිසා දෙව්ලොව කැටුව යාම
- අතරමගදී සිදු වන සිදුවීම්
- අවසානයේ නන්ද තෙරුන් වහන්සේ රහත්භාවයට පත්වීම

කතා රසය ජනිත වන ලෙස ඉදිරිපත් කිරීම

- පෙර සඳහන් කර ඇති කරුණු ඉදිරිපත් කිරීමේ දී කතුවරයා අනුගමනය කර ඇති රචනා විලාසය, අවස්ථා හා සිද්ධි ගැළපීම උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.

| | |
|---|---|
| එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වා තිබීම | ලකුණු 04යි |
| විස්තර කර තිබීම | ලකුණු 11යි |
| | මුළු ලකුණු 15යි |

### 3.5.4 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.7(a)

හතරවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වූවකි. ප්‍රස්තාරය 3.1 අනුව මෙම ප්‍රශ්නය සඳහා මුළු අපේක්ෂකයන්ගෙන් පිළිතුරු සපයා ඇත්තේ 59%ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය 15කි. ඉන්

| | |
|---|---|
| 0 - 3 ප්‍රාන්තරයේ | 48%ක් ද |
| 4 - 7 ප්‍රාන්තරයේ | 25% ක් ද |
| 8 - 11 ප්‍රාන්තරයේ | 21% ක් ද |
| 12 - 15 ප්‍රාන්තරයේ | 6%ක් ද |

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 07ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් පිරිස 73%කි. ලකුණු 08ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 27%කි.




**ප්‍රස්තාරය 3.7(b)**

හතරවන ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. "සැළලිහිණි සන්දේශය" ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නය සඳහා පහසුතාව 38%ක් වන අතර "නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව" ඇසුරෙන් සකස් වූ විකල්ප ප්‍රශ්නයෙහි පහසුතාව 34%කි. ඒ අනුව ප්‍රශ්නයට අදාළ ව පිළිතුරු ගොනු කිරීමේ දී නන්ද මහා තෙරුන් වහන්සේගේ වස්තුව ඇසුරෙන් පිළිතුරු සැපයීම වඩා සංකීර්ණ වී ඇති බව දැකිය හැකි විය.

නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න පිළිබඳ අයදුම්කරුවන් දැනුවත් කිරීමත් ප්‍රශ්නයට අදාළ ව පිළිතුරු ගොනු කිරීමට මනා පුහුණුවක් ලබා දීමත් අවශ්‍ය බැවින් පන්ති කාමරයේ දී ඒ පිළිබඳ අවධානය යොමු කිරීමට ගුරුභවතුන් කටයුතු කළ යුතු බව අවධාරණය කෙරේ.

## 5 ප්‍රශ්නය

අපේක්ෂණය : විචාර හා රසවින්දන හැකියාව මැනීම
ව්‍යුහය : 5, 6, 7 ප්‍රශ්නවලින් එකක් තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය.


**5.** කල්‍යාණ මිත්‍රත්වයේ බලය වැදි පුත්‍රයාගේ දරුණු සිත පවා මොළොක් කිරීමට සමත් වූ අයුරු 'චුල්ලහංස ජාතකය' ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

5.
- මලෙහි බැඳුණු හංස රජු නිදහස් කිරීම
- හංස රජු සුවපත් කිරීමට වැදි පුත්‍රයා කටයුතු කිරීම
- රජ්ජුරුවන් වෙත කැටිව යාම

වැනි කරුණු හෝ සුදුසු වෙනත් උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.

උදාහරණ 3ට - ලකුණු 03යි
විස්තරයට - ලකුණු 07යි
මුළු ලකුණු 10යි

### 3.5.5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.8(a)

මෙම ප්‍රශ්නය පන්සිය පනස් ජාතක කථා පොතේ චුල්ලහංස ජාතකය ඇසුරෙන් සැකසී ඇත. අපේක්ෂකයන්ගෙන් පිළිතුරු සපයා ඇත්තේ 20%ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය 10කි. ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 53%ක් ද
3 - 5 ප්‍රාන්තරයේ 33%ක් ද
6 - 7 ප්‍රාන්තරයේ 7%ක් ද
8 - 10 ප්‍රාන්තරයේ 7% ක් ද

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. ලකුණු 6ත් 10ත් අතර ලබා ඇති ප්‍රතිශතය 14%කි. 86%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 05ක් හෝ ඊට අඩුවෙනි.




**ප්‍රස්තාරය 3.8(b)**

පන්සිය පනස් ජාතක කථා පොතේ චුල්ලහංස ජාතකය ඇසුරෙන් ලිවීමට තිබූ මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 29%කි. නිර්දිෂ්ට පුරාතන සාහිත්‍ය කෘති පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කිරීමත් ඒ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු කිරීමත් නිරන්තර අභ්‍යාසවල නිරත කරවීමත් මගින් මෙවැනි ප්‍රශ්නවලට උපරිම ලකුණු ලබා ගැනීමට අවස්ථාව සැලසිය හැකි ය. ඒ පිළිබඳ ගුරු භවතුන්ගේ අවධානය යොමු විය යුතු බව අවධාරණය කෙරේ.

**6 ප්‍රශ්නය**

අපේක්ෂණය : විචාර හා රසවින්දන හැකියාව මැනීම

ව්‍යුහය : 5, 6, 7 ප්‍රශ්නවලින් එකක් තෝරා ගෙන පිළිතුරු


අපේක්ෂිත පිළිතුරු හා ලකුණු හා ලකුණු දීමේ පටිපාටිය

6.
- මල මිනියක මරනය නැත
- සොහොන් බිමක මරනය නැත
- මරනය රෙදි කඩකින් ඇස් දෙක නොවසයි
- බොරුවක් රැවටිල්ලක් කිසිවිට නොකරයි
- මරනය නොසැලී හිමාලයක් මෙන් ඔබ ළඟ සිටී
- අඩියෙන් අඩියට ඇස්පිල්මෙන් පිල්ලට
- මරනය වෙත ළංවන්නේ ඔබමයි.
- ජීවිතයැයි කියමින් - දවස ගානේ
  වැළඳ ගන්නේ ඔබ - මරනය පමණයි
- ජීවිතයයි මේ මොහොතින් මොහොතට
- ඇති වී නැතිවෙන්නේ
- පිච්චෙන පරඬැල් කොළයක් වාගෙයි ජීවය
- මරනයයි හැම බත් පිඬක්
- මරනයයි හැම හාදුවක්
- මරනයැයි කියා ඔබ දුවන්නේ
- මරනයේ සෙවනැල්ලටයි
- ජීවිතේමයි සැබෑ මරනය

වැනි උදාහරණ හෝ වෙනත් සුදුසු උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.

උදාහරණ 3ට - ලකුණු 03යි.
විස්තර කිරීම - ලකුණු 07යි
මුළු ලකුණු 10යි

### 3.5.6 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 5%කි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය 10කි. ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 67%ක් ද
3 - 5 ප්‍රාන්තරයේ 8%ක් ද
6 - 7 ප්‍රාන්තරයේ 0%ක් ද
8 - 10 ප්‍රාන්තරයේ 25%ක් ද

ලෙසින් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් 75%ක් ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත. ලකුණු 06ත් 07ත් අතර ලබා ඇති ප්‍රතිශතය 0%කි. ලකුණු 08 - 10ත් අතර ලබා ගත් අපේක්ෂක ප්‍රතිශතය 25%කි.

**ප්‍රස්තාරය 3.9(a)**




**ප්‍රස්තාරය 3.9(b)**

'මරනය නොසැලී හිමාලයක් මෙන්' පැදිපෙළ ඇසුරෙන් පිළිතුරු ලිවීමට තිබූ මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 11%කි. 5, 6, 7 යන ප්‍රශ්නවලින් අපේක්ෂකයන් අඩුම සංඛ්‍යාවක් තෝරා ගෙන ඇති මෙම ප්‍රශ්නයට අඩු පහසුතාවක් ලැබීමට හේතු වී ඇත්තේ නිර්දිෂ්ට නූතන පද්‍ය පිළිබඳ ව අපේක්ෂකයන්ගේ අවධානය නිසි පරිදි යොමු වී නොතිබීමත් නූතන පද්‍ය සාහිත්‍ය පිළිබඳ අවබෝධ කර ගැනීමට අවශ්‍ය නිසි මගපෙන්වීම නොලැබීමත් ය.

### 7 ප්‍රශ්නය

අපේක්ෂණය : විචාර හා රසවින්දන හැකියාව මැනීම
ව්‍යුහය : 5, 6, 7 ප්‍රශ්නවලින් එකක් තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය.

**7. පවුල් සංස්ථා තුළ ඇති සදාතනික බැඳීම් කවියට නැඟීමට කොළඹ යුගයේ කවීන් උත්සුක වී ඇති අයුරු නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක්වත් ඇසුරෙන් උදාහරණ දක්වමින් විස්තර කරන්න.** *(ලකුණු 10 යි)*


අපේක්ෂිත පිළිතුරු හා ලකුණු හා ලකුණු දීමේ පටිපාටිය

7.
- ධීවරී ගීතය
- අම්මා ඔබය
- දියෙහි ගිලුණු අයියාට
- ලෙච්චමීගේ සිතුවිල්ලක්
- රන් තැටියක කඳුළු

වැනි පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් උදාහරණ දක්වා තිබීම අවශ්‍ය ය.

උදාහරණ 3ට - ලකුණු 03යි
විස්තරයට - ලකුණු 07යි
මුළු ලකුණු 10යි

### 3.5.7 7ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





**ප්‍රස්තාරය 3.10(a)**

පවුල් සංස්ථාව තුළ ඇති සදාතනික බැඳීම කවියට නැඟීමට කොළඹ යුගයේ කවීන් උත්සුක වී ඇති අයුරු පාදක කරගෙන සැකසුණු මෙම ප්‍රශ්නයට ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 8%කි ඊට හිමි ලකුණු ප්‍රමාණය 10කි. ඉන්,

0 - 2 ප්‍රාන්තරයේ 61%ක් ද
3 - 5 ප්‍රාන්තරයේ 28%ක් ද
6 - 7 ප්‍රාන්තරයේ 11%ක් ද
8 - 10 ප්‍රාන්තරයේ 0%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 89%කි. ලකුණු 06ක් හෝ වැඩියෙන් ලබා ගෙන ඇත්තේ 11%කි.





**ප්‍රස්තාරය 3.10(b)**

මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 24%කි. කොළඹ කවීන්ගේ නිර්දිෂ්ට නිර්මාණ ඇසුරෙන් සැකසී ඇති මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගෙන් ලකුණු 05ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් ලබා ගත් 89%ක් අතුරෙන් 61%ක් ම ලකුණු 02ක් හෝ ඊට අඩුවෙන් ලබා තිබීම සැලකිලිමත් විය යුතු කරුණකි.

එමගින් පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නයට අපේක්ෂකයන් සපයා තිබූ පිළිතුරු ප්‍රශස්ත මට්ටමක නොතිබූ බවයි. නූතන පද්‍ය රසවින්දනය, එක් එක් පද්‍ය පන්තිවලින් ගම්‍ය වන අත්දැකීම් සේ ම පොදුවේ එක් එක් විෂයයන් මාතෘකා කර ගෙන කොළඹ කවීන් කාව්‍ය නිර්මාණයේ යෙදී ඇති අන්දම පිළිබඳව ද සමස්ත ඇගයීම් කිරීමට අපේක්ෂකයන්ට නිසි පුහුණුවක් ලබා දීමට මෙන් ම නිරන්තර අභ්‍යාසවල යෙදවීමට ගුරුභවතුන්ගේ අවධානයත් යොමු විය යුතු ය.

### 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්න වල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




**ප්‍රස්තාරය 3.11**

II ප්‍රශ්න පත්‍රයේ 1, 2, 3, 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

- 1වන ප්‍රශ්නය මගින් නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් කෙටි පිළිතුරු සැපයිය හැකි අනුප්‍රශ්න 10ක් ඉදිරිපත් කර ඇත. එම ප්‍රශ්න (අ), (ආ) ලෙස නැවත කොටස් දෙකකට බෙදා ඇත. ඒ අනුව කොටස් 20 සඳහා ලකුණු 20ක් හිමි වේ. එයට 100%ක් පිළිතුරු සපයා තිබුණි.

- 2වන ප්‍රශ්නය සැකසී ඇත්තේ නිර්දිෂ්ට ගද්‍ය, පද්‍ය පාඨ ඇසුරෙනි. නිර්දිෂ්ට පාඨ 5ක් ඇසුරෙන් ප්‍රශ්න සැකසෙන අතර එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 20ක් හිමි වේ. මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 89%ක් වන නමුත් එහි පහසුතාව 28%කි.

- 3 හා 4 ප්‍රශ්නවලින් නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ විශ්ලේෂණාත්මක දැනුම ඇගයීමට ලක් කෙරේ. මෙහි දී විකල්ප ප්‍රශ්න තෝරා ගැනීමේ අවස්ථාව ද අපේක්ෂකයන්ට හිමි වේ. මෙම ප්‍රශ්න දෙකට ලකුණු 15 බැගින් හිමි වේ.

- 3 ප්‍රශ්නය 'මියුණු ඇල්ල' පැදි පෙළ හා 'බැද්දේගම' නවකතාව ඇසුරෙන් සැකසුණු විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය. මෙම ප්‍රශ්න දෙකෙහි පහසුතාව පිළිවෙළින් 22%ක් හා 35%ක් වශයෙනි. මෙම ප්‍රශ්න දෙකේ සමස්ත පහසුතාව 28%කි.

- 4 ප්‍රශ්නය ද විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය. එහි සැළලිහිණි සන්දේශය ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයේ පහසුතාව 38%කි. නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයේ පහසුතාව 34%කි. මෙම ප්‍රශ්න දෙකේ සමස්ත පහසුතාව 36%කි.

- 5, 6,7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරා ගෙන පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට අවස්ථාව සලසා තිබේ. එම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ. ඉන් 5වන ප්‍රශ්නය පහසුතාව වැඩිම ප්‍රශ්නයයි. එහි පහසුතාව 29%කි. අඩුම පහසුතාව පෙන්නුම් කරනුයේ 6වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 11%කි. 6 හා7 ප්‍රශ්න දෙක පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය සාපේක්ෂකව අවම අතර එම ප්‍රශ්න දෙකෙහිම පහසුතාවද අඩු මට්ටමක පවතී.

## 4.0 පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානයට යොමු කළ යුතු කරුණු

පොදු උපදෙස්

- ★ ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද යන්න පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය. මේ සඳහා අමතර කියවීම් කාලය ඵලදායී ලෙස භාවිත කළ හැකි ය.

- ★ ප්‍රශ්න පත්‍රයේ පළමු කොටසට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ එක් පිළිතුරක් පමණක් තෝරා ගත යුතු ය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයා තිබේ දැයි සුපරීක්ෂාකාරී විය යුතු ය.

- ★ I ප්‍රශ්න පත්‍රයේ II කොටසට හා II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් ම පිටුවකින් ආරම්භ කළ යුතු ය

- ★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

- ★ අපේක්ෂකයාගේ විභාග අංකය හා පිටු අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය. අදාළ අවස්ථාවල දී සුදුසු නිදසුන් ඉදිරිපත් කළ යුතු ය.

- ★ පිළිතුරු සමන්විත විය යුතු වචන සංඛ්‍යාව දී ඇති විට එම වචන සංඛ්‍යාවට හැකි තරම් ආසන්න වචන සංඛ්‍යාවකින් යුතු වන සේ පිළිතුරු සංවිධානය කර ගත යුතු ය. එසේ නොවීම ලකුණු අඩුවෙන් ලැබීමට හේතු විය හැකි ය.

- ★ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී කාලය නිසි පරිදි කළමණාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය.

- ★ පිළිතුරු ලිවීමේ දි නිල් හෝ කළු පැහැ තීන්ත සහිත පෑන් පමණක් භාවිත කළ යුතු ය.

- ★ පිළිතුරු ලිවීමට සැපයෙන පොතේ සඳහන් විශේෂ උපදෙස් ද කියවා අවබෝධ කර ගත යුතු ය.

විශේෂ උපදෙස්

- ★ අත් අකුරු හා අක්ෂර වින්‍යාසය පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

- ★ ශිල්පීය දක්ෂතා එනම් පද බෙදීම, විරාම ලක්ෂණ, අදාළ පරිදි ඡේද වෙන් කොට ලිවීම යන අංශ පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය

## 5 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධන පිළිබඳ අදහස් හා යෝජනා

- සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙළපොත්වල ඇති පාඩම්, දෘශ්‍යාධාර හා ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථ භාවිත කරමින් නිවැරදි ව ලිවීමේ හැකියාවත් අක්ෂර මාලාවේ ඇති විවිධ ප්‍රභේද පිළිබඳව නිවැරදි අවබෝධයත් ලබා දීම අවශ්‍ය ය.

- අක්ෂර වින්‍යාසය බොහෝ විට වැරදි ලෙස භාවිත කෙරෙන වචන තෝරා ගෙන ඒවා නිවැරදි ව භාවිත කිරීම සඳහා සතතාභ්‍යාස කළ යුතු ය.

- උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව පෙළපොතේ දැක්වෙන අභ්‍යාසවලට අමතර ව තවත් අභ්‍යාසවල යොදමින් ක්‍රියාකාරකම්වල නිරත කළ යුතු ය.

- කර්මකාරක හා කර්තෘකාරක වාක්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සතුටුදායක නොවන බැවින් මනා ඉගැන්වීම් ක්‍රම මගින් හා වඩ වඩාත් අභ්‍යාසවල යෙදවීම මගින් භාවිත හැකියාව ඉහළ නැංවීමට පියවර ගත යුතු ය.

- සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහ්වර්ථ පද ඇතුලු වාග් කෝෂය සංවර්ධනය සඳහා උපකාර වන සරල අභ්‍යාසවල නිරත වීමට අවස්ථා සම්පාදනය කළ යුතු ය.

- ව්‍යාකරණ ඉගැන්වීමේ දී ප්‍රායෝගික ජීවිතය ඇසුරෙන් නිදර්ශන සපයමින් රසවත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් විසින් නිර්මාණය කර ගත යුතු ය.

- රචනා ලිවීමේ දී ව්‍යුහගත රචනාවක් යනු කුමක්දැයි පැහැදිලි කර විභාගයේ දී එවන් රචනාවකට ලකුණු ලැබෙන පිළිවෙළ හා ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳ ව මග පෙන්වීමක් කළ යුතු ය.

- ප්‍රායෝගික ලේඛන ලිවීමේ දී ඒ ඒ ලේඛනවල වෙනස හඳුන්වා දී ආකෘතිවල වෙනස්කම් සිසුන්ට පැහැදිලි කර දිය යුතු ය. වාර්තා, අත්පත්‍රිකා, දැන්වීම්, රාජකාරි ලිපි ඇතුලු ලේඛන කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ලේඛන අද්දැකීම් ලබා දීමට ක්‍රියාකළ යුතු ය.

- පැරණි ගද්‍ය සාහිත්‍ය පාඩම් සිසුන් ලවා කියවීම හා කියවීමෙන් අවබෝධය ලබා ගැනීමේ අවස්ථාව ලැබෙන පරිදි අභ්‍යාස සැලසුම් කළ යුතු ය.

- සාහිත්‍ය පෙළපොතෙහි පාඩම් මගින් රසාස්වාදය සඳහා ඉඩ ප්‍රස්තා ලැබෙන පරිදි හැකි සෑම විටම නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමට සුදුසු ඉගෙනුම් - ඉගැන්වීම් අවස්ථා සම්පාදනය කළ යුතු ය.

- නිරන්තර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව සිසුන් නිර්මාණකරණයේ යෙදවීමට ද උනන්දු විය යුතු ය.

- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

- වාර විභාග ලකුණු පදනම් කර ගනිමින් සිංහල විෂය සමත් වීමේ ලකුණු සීමාවට ආසන්න වී ඇති සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

- සන්වේදීභාවයෙන් හා රසඥතාවයෙන් පිරිපුන් රසිකයෙකු බිහි කිරීමෙහි ලා සාහිත්‍යයෙන් සිදු වනු යේ අනුපමේය මෙහෙයකි. එවන් පුද්ගලයන් සමාජය මහගු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍ය කෙරෙහි සිසුන් වඩාත් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳව ගුරුභවතුන් ඇතුළු අදාළ නිලධාරීන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

Printed by
Department of Examinations Press